# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2018

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ
පුද්ගලයන් නැවත පදිංචි කිරීම හා සමුපකාර
සංවර්ධන අමාත්‍යාංශය

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

# පෙරවදන

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2002.09.12 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.**

**මෙම වාර්තාවේ මුල් කොටසින් අමාත්‍යාංශයේ අංශ වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල කාර්යසාධනය පිළිබඳව විස්තර කර ඇත.**

**අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල කාර්ය සාධනය මෙම වාර්තාවේ දෙවෙනි කොටසින් දක්වා ඇත.**

**අමාත්‍යාංශයේ මානව සම්පත් තොරතුරු සහ 2018 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය අවසන් කොටසින් සවිස්තරාත්මකව දක්වා ඇත.**



# දැක්ම සහ මෙහෙවර

## දැක්ම

"සවිමත් වාණිජමය පරිසරයක් තුළින් ජාත්‍යන්තර තරඟකාරී
දේශීය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟීම"

## මෙහෙවර

"ශ්‍රී ලාංකීය **ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන්නාවූද,**
ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහි කරන්නාවූ,
සවිමත් වාණිජ අංශයකින් සමන්විතවූ ද, ධරණීය හා
තරඟකාරීත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි
අභිවෘද්ධිය සඳහා හිතකාමී වන පරිසරයක් නිර්මාණය කිරීම"



# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය

2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට පවරා ඇති විෂයපථය පහත පරිදි වේ.

1. කර්මාන්ත හා වාණිජ විෂයයන්ට හා දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන් හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති,වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය
3. වෙළඳ ප්‍රදර්ශණ පැවැත්වීම
4. දේශීය වෙළඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිලකට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
5. 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම
6. පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිළ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදවීම
7. පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
8. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම
9. බුද්ධිමය දේපල පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු
10. සීනි කර්මාන්තයට අදාළ රාජ්‍ය සම්පත් කළමනාකරණය හා සුරැකීම



# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ ආයතන

කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

කර්මාන්ත සංවර්ධන අංශය

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ පේෂ කර්මාන්ත සංවර්ධන අංශය

සංවර්ධන අංශ 1

සංවර්ධන අංශ 11

සංවර්ධන අංශ 111

කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා ප්‍රවර්ධන හා කළමනාකරණ තොරතුරු අංශය

කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 111- චක්‍රීය අරමුදල

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

සමුපකාර සංවර්ධන අංශය

**දෙපාර්තමේන්තු**

වාණිජ දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

**අධිකාරි, මණ්ඩල සහ කොමිෂන් සභා**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

සමුපකාර සේවක කොමිෂන් සභාව

**රාජ්‍ය ව්‍යවසායයන් සහ වාණිජ ආයතනය**

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

ලංකා සතොස සමාගම

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

ජාතික ශිල්ප සභාව

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)

සී/ස ලංකා සළුසල ආයතනය

සීමාසහිත ජාතික කාඩදාසි සමාගම

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ලංකා සිමෙන්ති සමාගම

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

හිඟුරාන සීනි කර්මාන්ත සමාගම

ලංකා ලේලන්ඩ් සමාගම

ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම

# පටුන


| | අංශ හා ආයතන | පිටු අංකය |
|---|---|---|
| | **අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක වන අංශ** | |
| **01** | කර්මාන්ත සංවර්ධන අංශය | 13-14 |
| **02** | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ පේෂ කර්මාන්ත සංවර්ධන අංශය | 15-16 |
| **03** | **ආංශික සංවර්ධන අංශය** | 17-18 |
| 3.1 | සංවර්ධන අංශ 1 | 19-20 |
| 3.11 | සංවර්ධන අංශ 11 | 21-22 |
| 3.lll | සංවර්ධන අංශ 111 | 23-24 |
| 3.iv | කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා ප්‍රවර්ධන හා කළමනාකරණ තොරතුරු අංශය | 25-26 |
| 3.v | රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 27-28 |
| **04** | සමුපකාර සංවර්ධන අංශය | 29-30 |
| **05** | කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 111- චක්‍රීය අරමුදල | 31-32 |
| | **දෙපාර්තමේන්තු** | 33-34 |
| 06 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 35 |
| 07 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 36-37 |
| 08 | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | 38 |
| 09 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 39-40 |
| | **අධිකාරි, මණ්ඩල සහ කොමිෂන් සභා** | 41-42 |
| 10 | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 43-44 |
| 11 | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | 45-47 |
| 12 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | 48-49 |
| 13 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 50 |
| | **රාජ්‍ය ව්‍යවසායයන් සහ වාණිජ ආයතන** | 52 |
| 14 | මාන්තායි සෝල්ට් ලිමිටඩ් | 53 |
| 15 | ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය | 54-55 |
| 16 | ලංකා සතොස සමාගම | 56-57 |
| 17 | ජාතික ශිල්ප සභාව | 58-59 |
| 18 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 60-61 |
| 19 | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 62 |
| 20 | පුහුණු සහ මානව සම්පත් සංවර්ධන තොරතුරු | 63 |
| 21 | කාර්යමණ්ඩල තොරතුරු | 65 |
| **22** | විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් | 66-68 |
| **23** | මූල්‍ය ප්‍රගතිය | 69-82 |

# අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක වන අංශ



# කර්මාන්ත සංවර්ධන අංශය

## හැඳින්වීම

සංවර්ධිත ප්‍රදේශ වලට පමණක් සීමා වී ඇති කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීමටත්, එමඟින් ජාතික ආදායමට කර්මාන්ත අංශයෙන් වන දායකත්වය ඉහළ නැංවීමටත්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අංශය දායක වෙයි. මෙම කර්තව්‍යයේ දී ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජන දිරිගැන්වීම, අවශ්‍ය වන යටිතල පහසුකම් සලසා දීම සහ තාක්ෂණික පහසුකම් හා උපදේශන සේවා ලබාදීම මෙම අංශයේ වගකීම වේ.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ සෑම පළාතක් සඳහාම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු ස්ථාපිත කර ඇත. මෙම කමිටුවේ කාර්යභාරය ලෙස පළාත් තුල කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන සැලසුම් සහ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය වන පහසුකම් සැලසීම සහ කර්මාන්ත සම්බන්ධ ආයෝජන තීරණයන් ක්‍රියාත්මක කිරීමට ආයෝජකයන්ට සහාය වීම හැඳින්විය හැකිය.

මෙම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ කාර්යභාරය ඉටු කිරීම පිණිස පළාත් මට්ටමින් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන 09 ක් ආරම්භ කර ඇති කර්මාන්තපුරවලින් වසර 35 ක් සඳහා වූ දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉඩම් කොටස් වෙන්කර දෙනු ලබයි.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**2.1:** වගුව

- **කර්මාන්ත පුර**

| සමුච්චිත ප්‍රගතිය - 2018 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 35 (දිස්ත්‍රික්ක 19 ක් තුළ) |
| සංවර්ධිත භූමි ප්‍රමාණය (විදුලිය, ජලය හා මාර්ග පද්ධතිය සමඟ) | අක්කර 1,162.25 |
| මුළු ආයෝජනය | රු.මි. 39,465.46 |
| රජයේ ආයෝජනය | රු.මි. 3,973.65 |
| පෞද්ගලික ආයෝජනය | රු.මි. 35,491.81 |
| වාණිජ නිෂ්පාදනයෙහි යෙදෙන කර්මාන්ත සංඛ්‍යාව | 244 |
| ඉදිකිරීම් අවස්ථාවේ ඇති කර්මාන්ත සංඛ්‍යාව | 82 |
| රැකියා අවස්ථා | 20,217 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

## ව්‍යාපෘති යෝජනා

| 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය | |
|---|---|
| ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් අනුමත කර ඇති නව ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 52 |
| අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 52 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද සහ ඒ අනුව කර්මාන්තපුර වලින් ඉඩම් වෙන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | 49 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

### කර්මාන්ත සංවර්ධනය ශක්තිමත් කිරීම

- මෙම අංශය මගින් කර්මාන්තකරුවන්ගේ ආයෝජන අවස්ථා ඉහළ නන්වමින් ඉහත කර්මාන්තපුරයන්හි සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබයි. 2018 වසර සඳහා මෙම අංශයට රුපියල් මිලියන 400 ක මුදලක් සංවර්ධන කටයුතු සඳහා වෙන් කර ඇත.

- **මාකඳුර (බටහිර) කර්මාන්තපුරය**

කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ගය රුපියල් මිලියන 34.64 වැය කරමින් සම්පූර්ණ කර ඇත.

- **බටඅත කර්මාන්තපුරය**

කර්මාන්තපුරයේ වීදි ලාම්පු අළුත්වැඩියා කිරීම හා නව වීදි ලාම්පු සවි කර ඇත.

- **නාලන්ද ( මාතලේ) කර්මාන්තපුරය**

අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 46.46 ක් පමණ මෙම වර්ෂයේදී වැය කර ඇත.

- **ටෙම්පල්බර්ග් කර්මාන්තපුරය**

අභ්‍යන්තර හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 76.0ක මුදලක් වැය කර ඇත.

**2.3: වගුව කර්මාන්තපුර තොරතුරු සාරාංශය (2018.12.31 දක්වා සමුච්චිත ප්‍රගතිය)**

| දිස්ත්‍රික්කය | කර්මාන්තපුරය | භූමි ප්‍රමාණය (අක්කර) | රජයේ ආයෝජනය – සමුච්චිත (රු. මි.) | පෞද්ගලික ආයෝජනය සමුච්චිත (රු. මි.) | ආයෝජකයින් සංඛ්‍යාව | සෘජු රැකියා | වාර්ෂික පිරිවැටුම (රු. මි.) |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | කොලොන්නාව | 7.00 | 36.07 | 520.60 | 14 | 553 | 612.80 |
| | රත්මලාන අදියර I & II | 17.00 | 61.03 | 2,402.40 | 27 | 1,172 | 3,030.50 |
| | ටෙම්පල්බර්ග් අදියර I & II | 48.00 | 169.04 | 5,084.50 | 37 | 1,896 | 5,103.90 |
| | රයිගම්පුර * | 87.00 | 42.77 | - | - | - | - |
| කළුතර | කළුතර | 50.00 | 93.53 | 1,940.72 | 32 | 962 | 1,219.11 |
| | මතුගම | 50.00 | 174.43 | 1,686.50 | 13 | 374 | 1,567.50 |
| | මිල්ලැව | 11.00 | 60.73 | 307.78 | 5 | 140 | 1,167.96 |
| ගම්පහ | මිනුවන්ගොඩ | 15.00 | 44.12 | 541.70 | 13 | 447 | 833.81 |
| | මහර | 2.50 | 14.05 | 226.00 | 6 | 134 | 263.30 |
| පුත්තලම | පුත්තලම | 40.00 | 120.79 | 140.00 | 7 | 95 | 114.00 |
| | දංකොටුව | 53.00 | 109.74 | 3,450.72 | 36 | 2,456 | 8,323.70 |
| | නුරාණි | 15.84 | 3.34 | 364.70 | 11 | 325 | 1,913.90 |
| කුරුණෑගල | මාකඳුර - නැගෙනහිර | 27.19 | 35.79 | 3,964.18 | 8 | 612 | 5,962.26 |
| | මාකඳුර - බටහිර | 65.56 | 95.94 | 3,612.15 | 17 | 1,176 | 14,718.82 |
| | දඹදෙණිය | 10.15 | 6.12 | 574.02 | 4 | 1,715 | 218.70 |
| | නිකවැරටිය | 2.55 | 38.36 | 129 | 1 | 596 | - |
| පොලොන්නරුව | ලක්ෂඋයන අදියර I & II | 63.90 | 176.04 | 1,584.56 | 14 | 728 | 1,071.30 |
| මාතලේ | නාලන්ද | 24.70 | 74.65 | 1,641.50 | 18 | 1,224 | 4,888.50 |
| මහනුවර | උලපනේ | 25.00 | 132.98 | 631.80 | 18 | 308 | 672.20 |
| ගාල්ල | කරන්දෙණිය | 40.00 | 57.01 | 379.31 | 16 | 380 | 539.12 |
| මාතර | උඩුකාව | 21.13 | 50.85 | 768.80 | 3 | 1,255 | 1,449.00 |
| හම්බන්තොට | බට අත | 105.00 | 316.23 | 1,713.88 | 13 | 262 | 983.14 |
| අම්පාර | නවගම්පුර | 20.00 | 118.08 | 137.70 | 8 | 44 | |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය අදියර I & II | 50.00 | 0.81 | 732.00 | 9 | 812 | |
| | ත්‍රිකුණාමලය අදියර III* | 25.00 | 265 | - | - | - | |
| මඩකළපුව | තිරයිමඩු | 24.30 | | - | 2 | - | |
| රත්නපුර | නාලන්ද එල්ලාවල I & II | 81.38 | 45.53 | 1,055.99 | 65 | 785 | 388.22 |
| | ඇඹිලිපිටිය | 22.81 | 511.07 | 161.90 | 6 | 187 | 86.04 |
| කෑගල්ල | ගලිගමුව | 21.59 | 134.49 | 674.40 | 13 | 360 | 13.79 |
| මොණරාගල | බුත්තල | 18.35 | 98.03 | 280.00 | 6 | 1,121 | 1,207.10 |
| | ඌව පරණගම | 3.30 | 168.49 | 15.00 | 1 | 11 | 6.60 |
| මන්නාරම | මන්නාරම | 24.00 | 305.75 | 770.00 | 2 | 87 | 360.0 |
| | මුසලි * | 25.00 | 167.12 | - | - | - | |
| මුලතිව් | වැලිඔය * | 40.00 | 245.67 | - | - | - | |
| | මාන්තායි - නැගෙනහිර * | 25.00 | | - | - | - | |
| **වෙනත් *** | | | | - | - | - | |
| | එකතුව | **1162.25** | **3973.65** | **35,491.81** | **425** | **20,217** | **56,715.27** |

* කර්මාන්තපුරවල් ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

***වෙනත්:-** කර්මාන්තපුර ස්ථාපනය කරන ලද දිනයේ සිට මේ දක්වා ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල පරිපාලන වියදම, උපදේශක ගාස්තු, වෙනත් වියදම් (භාෂා පරිවර්තන /පුවත්පත් දැන්වීම් ආදිය...), ආරක්ෂක වියදම් ඇතුලත් වේ.*

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන හා පේෂ කර්මාන්ත සංවර්ධන අංශය

### හැඳින්වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන හා පේෂ කර්මාන්ත සංවර්ධන අංශය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ඇගළුම් හා පේෂ කර්මාන්තය සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් සංවර්ධනය කිරීම හා නිෂ්පාදන ඵලදායිතාවය සහ ගුණාත්මකභාවය ඉහල නැංවීම මූල්‍ය සහයෝගිතාවය ලබා දීම සම්බන්ධ කටයුතු සිදු කරනු ලැබේ.

### 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධන වැඩසටහන් සහ එහි ප්‍රගතිය**

අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය උදෙසා පිහිටවනු ලැබූ කාර්ය සාධක බලකාය මගින් සිදු කළ නිර්දේශ අනුව පළාත් 09 තුළ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම, අළුත්වැඩියා කිරීම, ග්‍රාමීය පළාත්වල පේෂ කර්මාන්ත ගම්මාන ඇති කිරීම, අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ ලබා දීම සිදු කරනු ලබයි.

2018 වර්ෂයේ පේෂ කර්මාන්ත ගම්මාන වැඩසටහන සඳහා රුපියල් මිලියන 64.6ක් වෙන් කර ඇත. අත්යන්ත්‍ර ගම්මාන වල ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලදී. පුහුණුකරුවන් 207 දෙනෙකු පුහුණු කර ඇත. මෙම අත්යන්ත්‍ර ගම්මාන සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ පේෂ කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ඇති අතර, ප්‍රදානය කිරීමට කටයුතු කරන ලදී. යාපනය, කටුබැද්ද, බණ්ඩාරවෙල සහ මාතලේ පේෂ කර්මාන්ත පුහුණු පාසල් වලට යටිතල පහසුකම් සැපයීම, පේෂකර්ම මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම සිදුවෙමින් පවතී. පළාත් මට්ටමින් පේෂ කර්මාන්ත නවීකරණය කිරීම යටතේ පළාත් 09 ක පේෂකර්ම ප්‍රදර්ශන පැවැත්වීම සිදු කරමින් පවතී.

- **ඵලදායිතා වර්ධන වැඩසටහන**

පේෂ කර්මාන්තයේ තිරසර බව සඳහා නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීම පිණිස, ඔවුන්ගේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම මගින්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශාලා වල නිෂ්පාදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සඳහා නිෂ්පාදන කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට සහ සංවර්ධනය කිරීමට මෙම වැඩමුළුව පවත්වනු ලැබේ.

2018 වර්ෂය සඳහා රු. මි. 15ක් ඵලදායිතා වර්ධන වැඩසටහන සඳහා වෙන් කරන ලදී. ආයතන 09ක තාක්ෂණ නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මුළු පුහුණුකරුවන් සංඛ්‍යාව 263 කි. 2018 වසරේ ජූලි සහ අගෝස්තු යන මාසයන් තුළ අදියර “V” ට අදාල සියළුම වැඩ කොටස් ක්‍රියාත්මක කර ඇත.

- **කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ඇගළුම් කර්මාන්තයේ තාක්ෂණික හා කළමනාකරණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර තිබේ. 2018 වසර සඳහා රු.මි.2.5ක මුදලක් වෙන් කර ඇත. පුහුණු වැඩසටහන් 07ක් පිටකෝට්ටේ, බෝකුන්දර, වවුනියාව, කල්පිටිය, මොරටුව හා ගම්පොළ යන ස්ථාන වල පැවැත්වීය. අදියර 1 හා 11 ට අදාලව පුහුණුව ලැබූ මුළු පුහුණුකරුවන් සංඛ්‍යාව 206 කි. වැඩසටහන්වල ප්‍රගතිය 90% කි. මූල්‍ය ප්‍රගතිය රු.මි.2.0 කි.

- **ඇගළුම් ආශ්‍රිත කුඩා කර්මාන්තශාලා 150ක් පිහිටුවීම මගින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය**

2018 වසර සඳහා රුපියල් මිලියන 49.75 ක් වෙන් කරන ලදී. ව්‍යාපෘතිය සඳහා දැනට ප්‍රතිලාභීන් 135ක් තෝරා ගෙන ඇත. මධ්‍යස්ථාන 135ක යටිතල පහසුකම් පරීක්ෂාව සිදු කර ඇත. තාක්ෂණික පුහුණු වැඩසටහන් 135ක් පවත්වා ඇත. දැනට කර්මාන්තශාලා 126ක් ආරම්භ කර ඇත.

- **කෙසෙල් කෙඳි නූල් නිෂ්පාදනය සංවර්ධනය කිරීම**

කෙසෙල් කෙඳි ආශ්‍රිත නූල් නිෂ්පාදන පර්යේෂණ සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ අනෙකුත් ස්වභාවික නූල් සමඟ කෙසෙල් කෙඳි ආශ්‍රිත නූල් මිශ්‍ර භාවිතය සංවර්ධනය කිරීමයි.

මූලික පර්යේෂණ සිදු කර ඇති නිසා කෙඳි නූල්, කැටි නූල් සහ රෙදි සකස් කර ඇත. අවසාන ඉලක්කය වනුයේ “අපද්‍රව්‍ය වලින් ධනය” යන පාඨය යටතේ කෙසෙල් වගාවේ කෘෂි අපද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වාණිජමය වශයෙන් ප්‍රායෝගිකව නූල් නිෂ්පාදනයයි. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය සඳහා රු.මි. 15 ක් වෙන්කරන ලද අතර ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය (SLITA) මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මේ දක්වා සිදු කරන ලද සමස්ත වියදම රු.මි. 14 ක් වන අතර ප්‍රතිලාභීන් ගණන 250-300 පමණ වේ. පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව, කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. Intex-South Asia 2018 ප්‍රදර්ශනයේදී මෝස්තර නිරූපණ වැඩසටහනක් සහ කෙසෙල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශනයක් ද සිදුකරන ලදී. HPHT වර්ණ ගැන්වීමේ යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී (HPHT sample dyeing machine).

- **පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදන වල සෞඛ්‍ය සහ ආරක්ෂිතභාවය සහතික කරන ක්‍රමයක් ස්ථාපනය කිරීම.**

විවිධ ප්‍රභවයන් දේශීය වෙළෙඳපොළට පිවිසෙන පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදන සඳහා සෞඛ්‍ය හා ආරක්ෂාව නිෂ්පාදන සඳහා සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ ප්‍රමිති පවත්වා ගත යුතු අතර

මෙමඟින් රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා කරන රසායනික ද්‍රව්‍ය මඟින් ඇති විය හැකි සෞඛ්‍ය අවදානම වලක්වා ගත හැකිය.

රු.මි. 11.31 ක මුදලක් 2018 වර්ශය සඳහා වෙන් කර ඇත. භෞතික ප්‍රගතිය 100% කි.

- **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති සඳහා 2018 දී රුපියල් මිලියන 129.0 ක් වෙන් කරන ලදී. අමාත්‍යාංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය මගින් පහත සඳහන් පරිදි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ISO 14001 ලබා ගැනීමට පහසුකම් ලබා දීම තුළින් පිවිතුරු නිෂ්පාදන ප්‍රවර්ධන ක්‍රම ඇති කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා යොදා ගත හැකි සම්පත් පිළිබඳව සංඛ්‍යා දත්ත එකතු කිරීමේ ව්‍යාපෘතිය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආදිය වේ.

- **රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය**

රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම තුළින් ශ්‍රී ලංකා රජය කර්මාන්තකරුවන්ට ඉහල තාක්ෂණ හා ස්වයංක්‍රීය කර්මාන්තයක් කරා ගමන් කරන පහත දැක්වෙන අභියෝග වලට ප්‍රතිචාර දැක්වීම අපේක්ෂා කරයි.

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.80 ක මුදලක් අවුරුදු 5 ක කාලයක් එනම් 2016-2020 සඳහා අනුමත කර ඇත. එම මුදලින් රු.මි. 65 ක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත නිදහස් කර ඇත.

- **ව්‍යවසායකත්ව ගම්මාන සහ කාන්තා ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිල්ප සභාව හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරයි.

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී රු. මි. 40 ක්වෙන් කර ඇති අතර ගම්මාන 33 ක ප්‍රතිලාභීන් 556 ක් සඳහා ප්‍රතිලාභ ලබාදේ. පුහුණු වැඩසටහන්, පසු විපරම් වැඩසටහන්, තාක්ෂණික වැඩසටහන්, නව සැලසුම් වැඩසටහන්, අලෙවිකරණ වැඩසටහන්, කළමනාකරණ වැඩසටහන් සහ තෝරාගත් ගම්මාන සඳහා යන්ත්‍රෝපකරණ ලබාදීම යන වැඩ සටහන් සිදු කරන ලදී.

- **මානව සම්පත් සංවර්ධනය, තොරතුරු තාක්ෂණය, බදු සහ මූල්‍යන් පිළිබඳ ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම**

මෙහිදී ව්‍යාපාරික නීති රීති හා ඉහත කරුණු සම්බන්ධව දැනුවත් කරන අතර දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්රියාත්මක කිරීම සිදු කරයි. 2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට රු. මි. 7.0 ක් වෙන් කර ඇත.

- **ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් තරුණ ප්‍රජාව නංවාලීම**

මෙම වැඩසටහන තුළින් වෘත්තීය අධ්‍යාපනයේ නියැලී සිටින තරුණ පිරිස් සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහනකි. කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහන සිදු කරන අතර බස්නාහිර පළාතෙන් වැඩසටහන ආරම්භ කර ඇත.මේ ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයට රු.මි.5.7ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

# ආංශික සංවර්ධන අංශ



# සංවර්ධන අංශ 1

### හැඳින්වීම

කෘෂිකාර්මික කර්මාන්ත සංවර්ධන කටයුතු සංවර්ධන අංශ 1 යටතේ සිදුකරනු ලබයි. මෙම අංශය යටතේ සැකසූ ආහාර, තේ, කුළුබඩු, කොහු හා පොල් ආශ්‍රිත නිෂ්පාදන හා ඇසුරුම් කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලට රසායනාගාර පරීක්ෂණ සේවාවන් සහ පර්යේෂණ හා සංවර්ධන පහසුකම් සැපයීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය තුළ ප්‍රතීතකරණය කරන ලද අහාර රසායනාගාරයක් (Accredited Food Laboratory) ස්ථාපිත කිරීමේ දෙවන අදියර ආරම්භ කර ඇත. මෙම අදියරේදී රසායනාගාර ගොඩනැගිල්ලේ පළමු හා දෙවන මහල් ඉදිකිරීම් කටයුතු සිදු කරමින් ඉඩපහසුකම් පුළුල් කරනු ලබන අතර කර්මාන්ත සඳහා තරඟකාරී මිල ගණන් යටතේ රසායනාගාර පහසුකම් සැපයීම ආරම්භ කිරීමට නියමිතව ඇත.
- වැඩි ඝණත්වයෙන් යුත් (HDPE) පොලිතීන් භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන ආහාර දවටන (Lunch Sheet), තහනම් කරන ලද නීතියට සමගාමීව එකී නිෂ්පාදන වල නියැලී සිටි කර්මාන්ත වල යන්ත්‍ර ජෛව හායනයට ලක්වන ආහාර දවටන නිෂ්පාදන සිදු කල හැකි යන්ත්‍ර බවට පරිවර්තනය කිරීමට වැය වන පිරිවැය සඳහා ප්‍රතිලාභ ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව, මෙම ක්ෂේත්‍රයේ ලියාපදිංචි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ දැනට පවතින යන්ත්‍ර පරිවර්තනය කිරීමේ පිරිවැය ආවරණය කර ගැනීම සඳහා උපරිමය රු.200,000/- කට යටත්ව 50% ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම (රු. ලක්ෂ 4ක මුළු පරිවර්තන පිරිවැයෙන්) සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ මෙම අමාත්‍යාංශය එක්ව ක්‍රියාවට නංවා ඇත.
- තේ වල අගය එකතු කිරීම ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ ඇසුරුම්කරණ ක්‍රියාවලිය මඟින් සහ රසකාරක, විවිධ ඖෂධ, පලතුරු කොටස් ආදිය එකතු කිරීමෙනි. තීරු බදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) මඟින් කර්මාන්ත වල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට තේ වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් ඍජු හා වක්‍ර වශයෙන් අපනයනයට සම්බන්ධ කර්මාන්ත 224 ක් මෙම පහසුකම් ලබා ගෙන තිබේ.
- කොහු ආශ්‍රිත කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම ඉහළ නැංවීම පිණිස භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී තීරුබදු සහන සැපයීම සඳහා අමාත්‍යාංශය සහාය ලබා දෙනු ලැබේ. මෙමඟින් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟකාරීත්වය වැඩි කිරීම මෙයින් සිදු කරයි. දේශීය කොහු ආශ්‍රිත අපනයන කර්මාන්ත 52 සඳහා මේ යටතේ සේවා සපයා ඇත.

### තත්ත්වය/ ගුණත්වය ඉහල නැංවීමේ වැඩසටහන්

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහල නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සාර්ථකව නිම කරන කර්මාන්ත වෙනුවෙන් අදාල සහතික පත්‍ර සහ ගෙවීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව රු.300,000/- (උපදේශන ගාස්තු ද ඇතුළුව) උපරිමයකට යටත්ව අදාල සහතික පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙම වැඩසටහන සඳහා සැකසූ ආහාර කර්මාන්ත අංශය, ඇසුරුම්කරණ කර්මාන්ත අංශය, අගය එකතු කළ තේ කර්මාන්ත අංශය, අගය එකතු කළ කුළුබඩු අංශය සහ කොහු කර්මාන්තය නියෝජනය වන පරිදි 2018 වර්ෂය සඳහා කර්මාන්ත 50 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට අවස්ථාව සලසා ඇත.
- අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකපත් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. තෝරාගත් කර්මාන්ත සඳහා GMP සහතිකයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබා ගැනීමේ දී අවශ්‍ය මාර්ගෝපදේශනය සහ මූල්‍ය සහාය ලබාදේ. මෙම වැඩසටහන සාර්ථකව නිම කරන කර්මාන්ත වලට අදාල සහතික පත්‍ර ගෙවීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රු.100,000/- උපරිමයක් දක්වා අදාල සහතික පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කළ හැකි වේ. මෙම වැඩසටහන සඳහා කර්මාන්ත 80 ක් 2018 වර්ෂයේදී තෝරා ගන්නා ලදී.

### නිපුණතා සංවර්ධන වැඩසටහන්

- ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන සති අන්ත දින දොළහක කාල සීමාව තුළ සහතික පත්‍ර පාඨමාලාවක් වශයෙන් පැවැත්වීමට කටයුතු සිදු කර ඇත. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ඇසුරුම් කර්මාන්තයේ කාලීන අවශ්‍යතාවයක් වන තාක්ෂණික ශිල්පීන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීමයි. අමාත්‍යාංශය සහ ඇසුරුම් සංවර්ධන මධ්‍යස්ථානය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා ඇසුරුම් කර්මාන්තයේ නියැළී සිටින තාක්ෂණික ශිල්පීන් 24 දෙනෙකු සඳහා අවස්ථාව ලබා දී ඇත.

### අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමඟ ඒකාබද්ධව Profoods / Propack ප්‍රදර්ශනය 17 වැනි වරටත් 2018 අගෝස්තු මාසයේදී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී ඉතා සාර්ථකව පවත්වන ලදී.
- ඉන්දියාව, පකිස්තානය, චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ඩුබායි, තායිලන්තය, තායිවානය, මැලේසියාව, නෙදර්ලන්තය, සිංගප්පූරුව හා ජර්මනිය යන රටවල කර්මාන්ත ඇතුළුව ප්‍රධාන පෙළේ සියලුම දේශීය ආහාර නිෂ්පාදන කර්මාන්ත මෙම ප්‍රදර්ශනයට සහභාගී වූහ. අමාත්‍යාංශය සංවිධානය කළ විශේෂ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වෙන්කරන ලද විශේෂිත මණ්ඩපය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා විශේෂ සහන මත ප්‍රදර්ශන කුටි ලබාදෙන ලදී. එසේම, මෙම ප්‍රදර්ශනයේ දී

විශ්ව විද්‍යාල සහ කර්මාන්ත අතර සම්බන්ධතා ඇති කිරීමට සහ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීමේ අභිප්‍රායෙන් අමාත්‍යාංශය විසින් විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් සහභාගී කරවීමට ද කටයුතු කරන ලදී.

ඇසුරුම් නිෂ්පාදන සඳහා දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට “ලංකා පැක් -2018” ප්‍රදර්ශනය සැප්තැම්බර් මාසය තුළදී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී සාර්ථකව පවත්වන ලදී. දේශීය කර්මාන්තකරුවන්ට ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම, අත්දැකීම් ලබාගැනීමේ අවස්ථා ඇති කිරීමත්, ශ්‍රී ලංකාවේ ඇසුරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ (SLIP) සහයෝගය ඇතිව අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබීය.

- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම හා ජාත්‍යන්තර වෙළඳපල ආකර්ශනය කර ගැනීමට නැඟෙනහිර පළාත මූලික කරගත් සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්ත වලට ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වන ලදී. සහනදායී සේවාවන් යටතේ විශේෂිත වෙළඳ ප්‍රදර්ශන මණ්ඩපයක් අමාත්‍යාංශය විසින් සංවිධානය කර ඔවුනට පහසුකම් සැලසීම.

# සංවර්ධන අංශ 11

**හැඳින්වීම**

ගෝලීය වශයෙන් තරගකාරී ඉහළ ගුණාත්මක නිෂ්පාදන නිපදවීම සඳහා නිෂ්පාදන අංශයට එහි විෂය පථය යටතේ පහසුකම් සැලසීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

## අංශය යටතේ ඇති කර්මාන්ත

- අච්චු සහ තෙරපුම් අච්චු නිෂ්පාදන කර්මාන්ත
- රබර් ආශ්‍රිත කර්මාන්ත
- යන්ත්‍රෝපකරණ සහ ලෝහ කර්මාන්ත
- බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත
- වාහන නිෂ්පාදන සහ ප්‍රවාහන උපකරණ කර්මාන්තය
- දැව හා දැව ආශ්‍රිත කර්මාන්ත
- ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්ත
- රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත
- දෘෂ්ටි සහ ඡායාරූප උපකරණ කර්මාන්ත

### 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### නිපුණතා සංවර්ධන වැඩ සටහන

- **රබර් අංශය**

**අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩ සටහන (CPD)**

අඛණ්ඩ වෘත්තීමය සංවර්ධනය සහ තාක්ෂනික සංවර්ධනය ලෝක වෙළෙඳපොළ තුළ නවෝත්පාදන සහ වර්ධනය චිරස්ථායි ලෙස පවත්වා ගෙන යාම සඳහා ගෝලීයව තරගකාරීත්වය පවත්වා ගැනීම අවශ්‍ය වේ.

එබැවින් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනයේ සහයෝගීතාවයෙන් 2018 දෙසැම්බර් මස 06 - 07 දිනවල පෞද්ගලික අංශය, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සහ රජ්‍ය අංශයේ නිලධාරීන් යන තාක්ෂණික නොවන නිලධාරීන් 68 දෙනෙකු අඛණ්ඩ වෘත්තීමය සංවර්ධනය වැඩ සටහන පවත්වන ලදී.

- **උපාධිධාරී පොලිමර් විද්‍යා තාක්ෂණික වැඩ සටහන**

රබර් අංශයට අදාළ උපදේශක කමිටුව අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ නිපුණතා පරතරය හා ක්ෂේත්‍රයේ පැන නැගී ඇති ගෝලීය අභියෝග පිළිබඳව සාකච්ඡාවක් සිදුකරන ලදී. එබැවින්, ක්ෂේත්‍රයේ නියැලී සිටින පුද්ගලයින්ගේ නිපුණතාවය වැඩි දියුණු කිරීම ප්‍රමුඛතාවයක් ලෙස අමාත්‍යාංශය හඳුනාගෙන තිබේ.

එබැවින්, ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනයේ පොලිමර් විද්‍යා තාක්ෂණික උපාධිය හැදෑරීමට තාක්ෂණික ශ්‍රේණියේ සේවකයින් 19 ක් සඳහා අමාත්‍යාංශය මූල්‍ය ආධාර ලබා දී ඇත. උපාධිධාරී වැඩසටහනේ කාලය අවුරුදු 3 කි. වැඩසටහනේ මුළු පිරිවැය රු. 5,252,000කි. මුළු වියදමෙන් 50% ක් (රු.2,626,000) අමාත්‍යාංශය දරයි.

- **රබර් සංගම් (පර්ෂද) තරුණ ජාල වැඩසටහන (RCYN)**

රබර් ප්‍රධාන සැලැස්ම (**Rubber Master Plan**) යනු රටේ රබර් අංශය සංවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය ලියවිල්ලයි. ප්‍රධාන සැලසුමේ ඉලක්ක ලගා කර ගැනීම සඳහා ව්‍යාපෘති 25 ක් ඇතුළුව උපායමාර්ගික වැඩ සටහන් 10 කින් සමන්විත වේ. රබර් සංගම් (පර්ෂද) තරුණ ජාල වැඩසටහන ප්‍රධාන සැලැස්මෙහි එක් ප්‍රධාන ව්‍යාපෘතියක් වන අතර එය ලංකා රබර් ලේකම් කාර්යාලය සහ රබර් නිෂ්පාදන නිෂ්පාදන අංශයේ උපදේශක කමිටුව සමඟ එක්ව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් එය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී අමාත්‍යාංශය පෞද්ගලික අංශය, පර්යේෂණ ආයතන සහ රාජ්‍ය අංශය නියෝජිතයන් වන කණිෂ්ඨ, මධ්‍ය හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා නේවාසික නායකත්ව වැඩමුළු 07 ක් පවත්වන ලදී.

තවද, පෞද්ගලික හා රාජ්‍ය අංශයේ 148 දෙනෙක් වැඩමුළු 07 සඳහා සහභාගී වූ අතර අනාගත නායකයින් සඳහා සම්මාන ප්‍රදානෝත්සවය අමාත්‍යාංශය සංවිධානය කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වැය කළ මුදල මිලියන 10.25 කි.

### අලෙවි ප්‍රවර්ධනය

- **රබර් සහ මෝටර් රථ අංශය**

රබර් ප්‍රධාන සැලැස්ම (RMP) 2017-2026 යනු රබර් කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික න්‍යාය පත්‍රයයි. රබර් මාස්ටර් සැලැස්මේ එක් ප්‍රධාන ඉලක්කයක් වන්නේ 2025 දැක්ම සහ ජාතික අපනයන ක්‍රමෝපාය (NES) අනුව 2025 වසර වන විට අපනයන පිරිවැටුම ඇමරිකානු ඩොලර් බිලියන 3.5 දක්වා වැඩි කිරීමයි. රබර් නිෂ්පාදන කර්මාන්ත අංශයේ සහ මෝටර් රථ නිෂ්පාදන අංශයේ උපදේශක කමිටුව විසින් 2018 ජූනි 13 සිට 15 දින දක්වා මියන්මාරයේ දී COMPLAST (රබර්, මෝටර් රථ උපාංග සහ ප්ලාස්ටික් නිෂ්පාදිත) ප්‍රදර්ශනය සහ නියෝජිත කටයුතු සඳහා සහ 2018 නොවැම්බර් මස 13 සිට 16 දක්වා දකුණු අප්‍රිකාවේ පැවති ප්‍රදර්ශනය සහ නියෝජිත කටයුතු සඳහා ගුවන්යානා හා නවාතැන් පහසුකම් වලින් 50% ක් දැරීමට ඉල්ලා ඇත.

**තාක්ෂණ සංවර්ධනය**

- **ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනයේ පාඨමාලා NVQ ප්‍රමිති මට්ටමට වැඩි දියුණු කිරීම**

ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් හා රබර් ආයතනය ප්ලාස්ටික් හා රබර් අංශය සම්බන්ධ උපාධි, ඩිප්ලෝමා සහ පාඨමාලාව සහතික පත්‍ර පාඨමාලා පවත්වන ශ්‍රී ලංකාවේ එකම ආයතනය යි. ඒ නිසා PRI විසින් පාඨමාලා NVQ ප්‍රමිතියට වැඩිදියුණු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව මෙම ක්ෂේත්‍රයේ තාක්ෂණික කුසලතා නැංවීමේ පාඨමාලා වල වැදගත්කම සැලකිල්ලට ගනිමින් නව විෂය නිර්දේශයේ සන්දර්භය හා ව්‍යුහය සකස් කිරීම සඳහා ඔවුන්ගේ

දේශනවලට අනුව ඉගැන්වීම් පුරුදු පුහුණු කිරීම සඳහා අමාත්‍යාංශය මූල්‍ය ආධාර ලබා දී ඇත.

එබැවින්, 2019 දෙසැම්බර් මස 15 -16 වන දින පෞද්ගලික අංශයේ, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සහ රාජ්‍ය අංශයේ නිලධාරීන් 75 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පැවැත්විණි. පිරිවැය: රුපියල් මිලියන 0.620 කි.

**පර්යේෂණ** හා සංවර්ධන

- **ලෝහ අංශය**
  - **ලෝහ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමිතිකරණය**

ලංකාවේ ලෝහ කර්මාන්තය ඈත අතීතයේ සිටම පැවති අතර 16 වන සියවසේදී ඒ සම්බන්ධව වාර්තා වී ඇත. ලෝහ කර්මාන්තය රටේ අනෙකුත් කර්මාන්තවලට සහයෝගය දක්වයි. රට පුරාම ව්‍යාප්ත වූ අතර එහි විධිමත් හා අවිධිමත් කර්මාන්තවල 60,000 කට වැඩි පිරිසක් සේවය කරයි. ආර්ථිකයට විශාල දායකත්වයක් සපයයි.

ලෝහ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ උපදේශක කමිටුව කර්මාන්ත කොමිසම හරහා ලෝහ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති හඳුන්වා දීමට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යය සඳහා ශ්‍රී.ලං.ප්‍ර.ආ., වාණිජ දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය (IDB), ශ්‍රී ලංකා රේගුව හා පුද්ගලික අංශයේ සහයෝගයෙන් කමිටුවක් පිහිටුවා ඇත.

එබැවින්, පාරිභෝජන භාණ්ඩ වශයෙන් බහුලව භාවිතා වන අයිතම 06 සඳහා ප්‍රමිති හඳුන්වා දීමට කමිටුව තීරණය කර ඇත. ඒවා වතුර පොම්ප, පාසැල් වතුර බෝතල්, ඇලුමිනියම් අපද්‍රව්‍ය, ඉසින යන්ත්‍ර, ඇලුමිනියම් පිසින භාණ්ඩ සහ පිහි වේ. අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා පැවැත්වෙන අතර 2019 දී ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

# සංවර්ධන අංශ 111

## හැඳින්වීම

ජාත්‍යන්තර වෙළඳපල තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහත සඳහන් කර්මාන්ත උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

## අංශය යටතේ පවතින කර්මාන්ත උප අංශ

- පාවහන්
- සම් භාණ්ඩ
- පිඟන් භාණ්ඩ
- විද්‍යුත් හා විදුලි උපකරණ
- ඖෂධ හා සුවඳ විලවුන් කර්මාන්තය
- තීන්ත හා මුද්‍රණ කටයුතු කර්මාන්තය
- රසායන ද්‍රව්‍ය / රෙදිපිළි නිෂ්පාදනය සඳහා වූ අමතර කොටස්/අනෙකුත් කර්මාන්ත

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### පාවහන් හා සම්භාණ්ඩ කර්මාන්තය

- **පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය**

මෙම වසරේදී ද මෙම ප්‍රදර්ශනය සාර්ථකව පවත්වන ලද අතර අමාත්‍යාංශය විසින් මේ සඳහා රුපියල් මිලියන 4 ක් වැය කර ඇත.

විදේශීය ප්‍රදර්ශන කුටි 22 ක් ද ඇතුලත්ව ප්‍රදර්ශන කුටි 230 කින් සමන්විත වූ මෙම ප්‍රදර්ශනය සඳහා දේශීය පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදන ආයතන 108 ක් ද, නරඹන්නන් 16,000 කට අධික පිරිසක්ද සහභාගී වී ඇත.

- **දේශීය සම් නිෂ්පාදකයින් සඳහා නව තාක්ෂණය ලබා ගැනීම සඳහා වූ වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය සම් නිෂ්පාදකයින් සඳහා පරිසර හිතකාමී නව තාක්ෂණය හඳුන්වා දීමට සැලසුම් සකස් කර ඇත.

- **පාවහන් නිෂ්පාදන පුහුණු වැඩසටහන**

අමාත්‍යාංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය සමග එක්ව මන්නාරම, කුරුණෑගල හා මහනුවර යන දිස්ත්‍රික්කයන්හි සුළු පරිමාණ පාවහන් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනයන් හි තත්ත්වය ඉහළ නැංවීම හා නව තාක්ෂණය හඳුන්වා දීම අරමුණු කරගනිමින් පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලද අතර, මෙහිදී පුහුණු වන්නන් 85 දෙනෙක් සඳහා පුහුණුව ලබා දෙන ලදී. මේ සඳහා අමාත්‍යාංශය රුපියල් මිලියන 02 කට ආසන්න මුදලක් වැය කොට ඇත.

- **ඖෂධ හා සුවඳ විලවුන් අංශය**

➢ රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ මිලදී ගැනීමේ දී දේශීය නිෂ්පාදකයින්ගෙන් ලබා ගන්නා ප්‍රමාණය ඉහල නැංවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

➢ සුවඳ විලවුන් ආඥා පනත සැකසීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට සහාය වීම.

➢ කොළඹ විශ්ව විද්‍යාලය තුළ පිහිටුවා ඇති ශ්‍රී ලංකා ඖෂධ හා සුවඳ විලවුන් පර්යේෂණාගාරයෙහි සුවඳ විලවුන් නිෂ්පාදන ආශ්‍රිත පර්යේෂණ පහසුකම් ඉහල නැංවීම සඳහා අවශ්‍ය නවීනතම යන්ත්‍ර හා උපකරණ ලබා ගැනීම පිණිස රුපියල් මිලියන 22.5 ක් ලබා දීමට කටයුතු කර ඇත.

- **විදුලි හා විද්‍යුත් භාණ්ඩ අංශය**

- **විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ නව නිර්මාණ එළි දැක්වීමේ ප්‍රදර්ශනය (INCO ප්‍රදර්ශනය)**

මෙම ප්‍රදර්ශනය පැවැත්වීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ දේශීය කර්මාන්තකරුවන් දිරිගැන්වීම හා ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සඳහා යහපත් වෙළඳපොලක් බිහිකර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීමයි.

මෙම වසරේදී ද ඉහත සඳහන් ප්‍රදර්ශනය සාර්ථකව පවත්වන ලද අතර, අමාත්‍යාංශය විසින් මේ සඳහා රුපියල් මිලියන 1.5 ක් වැය කර ඇත. ප්‍රදර්ශන කුටි 248 කින් සමන්විත වූ මෙම ප්‍රදර්ශනයෙහි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ද ප්‍රදර්ශන කුටි 42 ක් වෙන් කර තිබීම විශේෂ ලක්ෂණයකි. එසේම මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා 145,000 කට අධික නරඹන්නන් සංඛ්‍යාවක් ද සහභාගී වී ඇත. මෙමඟින් නව තාක්ෂණික නිර්මාණ එළි දැක්වීමට අවශ්‍ය අනුග්‍රහය ලබා දීම සිදුවේ.

### පිඟන් භාණ්ඩ අංශය

- **දේශීය රතු මැටි උළු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා ගැනීමේ වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය රතු මැටි උළු කර්මාන්තකරුවන් 20 දෙනෙක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කර ඇති අතර, මේ සඳහා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 4.3 ක මුදලක් වියදම් කර ඇත.

- **දේශීය උළු නිෂ්පාදන කර්මාන්ත සඳහා නවීන තාක්ෂණයෙන් යුත් උළු වියලනයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ, උළු වියලන යන්ත්‍රය හා අදාල උපකරන පිහිටුවීම හා සවිකිරීම සඳහා රුපියල් මිලියන 2 ක් වියදම් කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් දේශීය උළු කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමෙන් කාර්යක්ෂමතාව ඉහල නැංවීමත්, නිෂ්පාදනයන්හි තත්ත්වය උසස් කිරීමත් බලාපොරොත්තු වේ. මෙහි නියමු ව්‍යාපෘතිය මේ වන විට අවසන් කර ඇති අතර, වැඩි දුර සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- **දේශීය කර්මාන්ත නගා සිටුවීමේ අරමුනින් පිහිටුවා ඇති පර්යේෂණ හා සංවර්ධන අරමුදල**

දේශීය කර්මාන්ත නගා සිටුවීමට අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සිදු කිරීම පිණිස පිහිටුවා ඇති පර්යේෂණ හා සංවර්ධන අරමුදල යටතේ, මේ වන විට කර්මාන්තකරුවන් 09 දෙනෙකුගේ නව ව්‍යාපෘති 09 ක් සඳහා රුපියල් මිලියන 8.3 ක් මූල්‍ය ආධාර ලෙස ලබා දී ඇත.

**අනෙකුත් වැඩසටහන්**

- **ඉදිකිරීම් - 2018 ප්‍රදර්ශනය**

මෙම ප්‍රදර්ශනය පැවැත්වීමෙන් දේශීය ඉදිකිරීම් කර්මාන්තයෙහි තරඟකාරිත්වය හා ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් දිරිමත් කිරීම සහ දේශීය ඉදිකිරීම් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන හා සේවාවන් මෙන්ම නව තාක්ෂණය ප්‍රදර්ශනයට අවස්ථාව සලසා දීම හා විදේශීය ආයෝජනයට ඉඩ සැලසීම යන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරයි.

මෙම ප්‍රදර්ශනය 2018 වසරේදී ද සාර්ථකව පවත්වන ලද අතර, අමාත්‍යාංශය විසින් මේ සඳහා රුපියල් මිලියන 1 ක මූල්‍ය දායකත්වයක් ලබා දී ඇත. දේශීය හා විදේශීය ප්‍රදර්ශන කුටි 300 කට අධික ප්‍රමානයකින් සමන්විත වූ මෙම ප්‍රදර්ශනය සඳහා නරඹන්නන් 40,000 කට අධික ප්‍රමාණයක් ද සහභාගී වී ඇත.

## කර්මාන්ත ලියාපදිංචි අංශය

### හැඳින්වීම

**ප්‍රධාන අරමුණු / පරමාර්ථ**

- කර්මාන්ත ලියාපදිංචිය ඉහළ නැංවීම.
- නිෂ්පාදන කර්මාන්ත වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීම.

**කාර්යභාරය**

- කර්මාන්ත ලියාපදිංචිය සහ එයට අදාළ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.
- බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හා බලශක්ති පිරිවැය අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය-දෙවන අදියර**
  - බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම මඟින් නිෂ්පාදන කර්මාන්තයන් හි ඵලදායිතාවය වර්ධනය කිරීම, ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ඉතිරි කර දීම හා කාර්මික පිරිවැය අවම කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් නිෂ්පාදන කර්මාන්තයන්හි බලශක්ති විගණනයන් මඟින් ඒවායේ බලශක්ති අවශ්‍යතාවයන් හඳුනා ගැනීම, බලශක්තිය අපතේ යන ආකාර හඳුනාගැනීම සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අවශ්‍ය නිර්දේශ සැපයීම සිදුකෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රු.මි. 4.5කි.

කර්මාන්තශාලා අධ්‍යයනය කිරීමෙන් ලබාගත් මූලික දත්ත පදනම් කරගනිමින් මූලික බලශක්ති විගණනයන් සිදුකෙරේ. ඉන් අනතුරුව, සවිස්තරාත්මක බලශක්ති විගණනයන් සිදුකර බලශක්ති සංරක්ෂණය සිදුකිරීමට නිර්දේශ ලබා දීම සිදු කෙරේ. මේ වන විට කර්මාන්තශාලා 10 ක් සඳහා සවිස්තරාත්මක බලශක්ති විගණනය නිම කර ඇත. මෙය කර්මාන්ත පරිශ්‍රය සම්පූර්ණයෙන් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව නවීන ඉලෙක්ට්‍රොනික මිනුම් උපකරණ භාවිතයෙන් සිදුකරන සංගණනයක් වන අතර, මූලික සූදානම, සැලසුම් කිරීම, පූර්ව මාස 12 සඳහා බලශක්ති දත්ත විශ්ලේෂණය, පරීක්ෂා කිරීම සහ එමඟින් මිනුම් ලබා ගැනීම, ගණනය කිරීම, ඇගයුම සහ බලශක්ති සංරක්ෂණ අවස්ථා සඳහා නිර්දේශ ලබා දීම යන අංගයන්ගෙන් සමන්විත වේ.

2018 දෙසැම්බර් මස 31 දිනට ව්‍යාපෘති වියදම රු. මි. 1.8 කි. ව්‍යාපෘතිය 2019 වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කර තිබේ.

**කර්මාන්ත ලියාපදිංචිය**

**7.1:** වගුව

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති නිෂ්පාදන කර්මාන්ත ආයතන**

**(උප අංශ වශයෙන් 2018 දෙසැ. 31 දිනට)**

| උප අංශය | සංඛ්‍යාව (2017 දෙසැ. | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව (2018 දෙසැ. 31 | ප්‍රතිශතය (%) | වර්ධනය (%) |
|---|---|---|---|---|---|
| ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන (31) | 411 | 16.3 | 451 | 16.9 | 9.73 |
| රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ (32) | 511 | 20.3 | 521 | 19.5 | 1.96 |
| දැව සහ දැව නිෂ්පාදන (33) | 86 | 3.4 | 90 | 3.4 | 4.65 |
| කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන (34) | 207 | 8.2 | 225 | 8.4 | 8.70 |
| රසායනික/ඛණිජ තෙල්/ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (35) | 570 | 22.7 | 594 | 22.2 | 4.21 |
| ලෝහ නොවන නිෂ්පාදන (36) | 133 | 5.3 | 152 | 5.7 | 14.29 |
| මූලික ලෝහ නිෂ්පාදන (37) | 65 | 2.6 | 70 | 2.7 | 7.69 |
| සැකසූ ලෝහ නිෂ්පාදන (38) | 424 | 16.9 | 461 | 17.2 | 8.73 |
| අනෙකුත් (39) | 107 | 4.3 | 110 | 4.0 | 2.80 |
| **එකතුව** | **2,514** | **100** | **2674** | **100** | **6.36** |

*මූලාශ්‍රය : කර්මාන්ත ලියාපදිංචිය ආශ්‍රිත දත්ත පාදකය*

**අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති කර්මාන්ත ආයතන ප්‍රතිශතයක් ලෙස -2018 දෙසැම්බර් 31 දක්වා**

ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන (31) - 16.87%

රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ (32) - 19.48%

දැව සහ දැව නිෂ්පාදන (33) - 3.37%

කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන (34) - 8.41%

රසායනික/ඛණිජ තෙල්/ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (35) - 22.21%

ලෝහ නොවන නිෂ්පාදන (36)- 5.68%

මූලික ලෝහ නිෂ්පාදන (37) - 2.62%

සැකසූ ලෝහ නිෂ්පාදන (38) - 17.24%

අනෙකුත් (39)- 4.11%

*මූලාශ්‍රය : කර්මාන්ත ලියාපදිංචිය ආශ්‍රිත දත්ත පාදකය*

# රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

### හැඳින්වීම

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය යනු අංක 58/2007 රසායනික අවි සම්මුති පනතට අනුව එකී සම්මුතියේ ජාතික වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ යටතේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයකි. රසායනික අවි සම්මුතිය යනු රසායනික අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය, හුවමාරු කිරීම තොග රැස්කිරීම හා භාවිතය තහනම් කිරීම හා ඒවා විනාශ කිරීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුමයි. මීට අමතරව, සම්මුතිය යටතේ ලැයිස්තුගත කර ඇති රසායනික ද්‍රව්‍ය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වල සාමකාමී භාවිතය මෙම සම්මුතිය මගින් අධීක්ෂණය කරනු ලැබේ.

### 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්නන් ලියාපදිංචි කිරීම**

ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය පරිහරණය කරනු ලබන කර්මාන්ත ශාලා 36 ක් මේ දක්වා ලියාපදිංචි කර ඇත. ඒ අතරින් කර්මාන්ත ශාලා 03 ක් 2018 වසර සඳහා ලියාපදිංචි වී ඇත.

- **බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කිරීම**

2007 අංක 58 දරණ රසායනික අවි සම්මුති පනතට අනුව ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය ආනයනය හා අපනයනය කිරීමට ජාතික අධිකාරියෙන් නිර්දේශ ලබාගැනීම අත්‍යවශ්‍ය වේ. ජාතික අධිකාරිය 2018 වසර සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට නිර්දේශ 47 ක් ඉදිරිපත් කර ඇත.

- **කාලානුරූපී විමර්ශන**

සියළුම රසායනික කර්මාන්ත ශාලා රාජ්‍ය ප්‍රතිපත්ති සහ රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ අරමුණු වලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරම් පරීක්ෂා කල යුතු ය. 2018 දී රසායනික කර්මාන්ත ශාලා 10 ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

- **රසායනික අවි සම්මුතිය පිළිබඳ පොදු ජනතාව දැනුවත් කිරීම**

2018 අගෝස්තු මස 29 සිට 31 දින දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ පවත්වන ලද V 2025 ප්‍රදර්ශනයට ජාතික අධිකාරිය සහභාගී විය. මෙම ප්‍රදර්ශනයේ දී රසායනික අවි සම්මුතිය සහ ගෘහස්ත රසායනික ද්‍රව්‍ය ආරක්ෂිත භාවිතය සම්බන්ධයෙන් පාසැල් සිසුන් සහ මහජනතාව දැනුවත් කරන ලදී. එසේම පුද්ගල ආරක්ෂක උපකරණ ද ප්‍රදර්ශනය කරන ලදී.

- **ශ්‍රී ලංකාව තුල ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය පරිහරණය කරන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන**

රසායනික අවි සම්මුතියේ අරමුණු ව්‍යවස්ථානුකූල කටයුතු සම්බන්ධ රාජ්‍ය පාර්ශවයන්ගේ වගකීම් හා ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය පරිහරණය කරන්නන් පිළිපැදිය යුතු පටිපාටි පිළිබඳ දැනුවත් කිරීම සඳහා විශේෂිත දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2018 ජූලි මස 28 වන දින SLIDA ආයතනයේ පවත්වන ලදී.

### අන්තර්ජාතික සහයෝගීතාව

- **OPCW වෙත වාර්ෂික වාර්තා යැවීම**

මෙම සම්මුතියේ පාර්ශව රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව, 2017 වසරට අදාල වාර්තා හා සංඛ්‍යා ලේඛන රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත යවා ඇත.

- **OPCW මගින් පවත්වනු ලබන 2018 අන්තර්ජාතික සහයෝගීතා පුහුණු වැඩසටහන සම්බන්ධීකරණය**

රසායනික ද්‍රව්‍ය සාමකාමී භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත සුරක්ෂිතභාවය අවධාරණය යන කරුණු අරමුණු කරමින් OPCW මගින් වාර්ෂිකව අන්තර්ජාතික පුහුනු වැඩසටහනක් නෙදර්ලන්තය හා සාමාජික රාජ්‍යයන් හි සංවිධානය කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ OPCW විසින් නම් කරන ලද බංගලාදේශය සහ බුරුන්ඩි ජාතික නියෝජිතයන් දෙදෙනෙකුට 2018 සැප්තැම්බර් මස 10 සිට 28 දක්වා ශ්‍රී ලංකාවේ පෞද්ගලික කර්මාන්ත ආයතනයක අධ්‍යයන කටයුතු සඳහා ජාතික අධිකාරිය විසින් අවස්ථාව ලබාදෙන ලදී.

- **ජාත්‍යන්තර වැඩමුළුව**

දකුණු ආසියානු රාජ්‍ය පාර්ශවයන් සඳහා රසායනික සුරක්ෂිතතාව සහ ආරක්ෂාව කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුවක් නෙදර්ලන්තයේ පිහිටි රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය සමග එක්ව 2018 දෙසැම්බර් මස 4 වන දින සිට 6 වන දින දක්වා කොළඹ සිනමන් ලේක් සයිඩ් හෝටලයේදී දී පැවැත්විය. මේ සඳහා දකුණු ආසියානු කලාපීය රටවල නියෝජිතයන් 30 ක් සහභාගී විය.

### ජාතික ආරක්ෂක වැඩපිළිවෙල

- **ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය පරිහරණය කරන කර්මාන්තශාලා සඳහා හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම සඳහා සහාය වීම**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වනුයේ හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම මගින් කර්මාන්ත වල අනතුරු හා රසායනික ද්‍රව්‍ය හා සම්බන්ධ සිද්ධීන් අවම කිරීමයි. කර්මාන්ත ශාලා 10ක් මේ සඳහා සහභාගී වූ අතර ඔවුන් විසින් හදිසි අවස්ථා කළමනාකරණ සැලැසුම් සකස් කර 2018 අප්‍රේල් 09 දින ජාතික අධිකාරියට ඉදිරිපත් කර ඇත.

- **රසායනික, ජීව විද්‍යාත්මක විකිරණ සහ න්‍යෂ්ටික (CBRN) ප්‍රතිචාර දැක්වීමේ පුහුණු වැඩසටහන**

2018 අප්‍රේල් 23 සිට 27 දක්වා මෝදර යුධ හමුදා කඳවුරේ දී රසායනික අවි සම්මුතිය සහ රසායනික අවි කාරක පිළිබඳ දින පහක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී .මේ සඳහා ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් 40 දෙනෙකුට වැඩි පිරිසක් වූහ.

- **දේශන සභාය - 06**

ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ඇඹිලිපිටිය යුද හමුදා කඳවුරෙහි හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි සංවිධානය කරන ලද රසායනික හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ වැඩමුළු සඳහා දේශන සභාය ජාතික අධිකාරිය විසින් ලබා දී ඇත.

- **දේශීය පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහන් - 03**

ජාතික අධිකාරිය විසින් ශ්‍රී ලංකා පොලිසියේ STF ආරක්ෂක අංශයේ නිලධාරීන් කණ්ඩායමකට "රසායනික තර්ජනයන්ට එරෙහිව ප්‍රභූන් ආරක්ෂා කිරීම" මැයින් පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී.

**නිපුණතා සංවර්ධන වැඩසටහන්**

- **කර්මාන්තපුර සඳහා රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව භාවිතය, ගිනි නිවීම සහ ප්‍රථමාධාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - 04**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ තිරසාර කර්මාන්ත සංවර්ධනය සඳහා කර්මාන්ත පරිශ්‍ර වල ආරක්ෂාව හා සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමයි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන කර්මාන්ත පුර හතරක් තුළ සිදු කරන ලද අතර මෙම වැඩ සටහන් සාර්ථක කර ගැනීම සඳහා කර්මාන්ත වලින් ඉහළ දායකත්වයක් ලැබිණි.

- **කාර්මික ආරක්ෂාව, හදිසි අවස්ථා සඳහා සූදානම සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

අධ්‍යාපනය හරහා කාර්මික ගැටළු අවම කිරීම අරමුණු කරගෙන කාර්මික සුරක්ෂිතතාව, හදිසි අවස්ථා සඳහා සූදානම සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ මාස පහක සහතිකපත් පාඨමාලාවක් පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීව පවත්වන ලදී.

මෙම පාඨමාලාවේ සහතික පත් ප්‍රධානෝත්සවය 2018 ජූනි 16 වන දින පැවැත්විණි.

මෙම පාඨමාලාවේ 05 වන කාණ්ඩය 2018 ඔක්තෝබර් 06 වන දින ආරම්භ කරන ලදී.

- **කෘෂි රසායනික ද්‍රව්‍ය වල ආරක්ෂිත භාවිතය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන**

අධ්‍යාපනය තුළින් ගොවි ජනතාවගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටලු අවම කර ගැනීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ස්ථාන 04 ක් තුළ (මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, බකමූණ, මනම්පිටිය) වැඩසටහන් මාලාවක් 2018 ඔක්තෝබර් 09 සිට 12 දක්වා පැවැත්විය. මෙම වැඩසටහන සඳහා සහභාගී වූ ගොවි මහතුන් හට පුද්ගල ආරක්ෂිත උපකරණ කට්ටල 400 ක් බෙදා දෙන ලදී. එක් උපකරණ කට්ටලයක් තුළ පා ආවරණ යුගලයක්, අත් ආවරණ යුගලයක්, ආරක්ෂිත ඇස් ආවරණක්, කැනිස්ටරයක් සහිත මුඛ ආවරණයක් අඩංගු වේ).

**10.1.** වගුව

**ජාත්‍යන්තර වැඩසටහන් හරහා පාර්ශ්වකරුවන්ගේ ආයතන වල හැකියාවන් වර්ධනය කිරීම**

| පාඨමාලාව | සහභාගී වූ සංඛ්‍යාව | රට |
|---|---|---|
| විශ්ලේෂණ කුසලතා | 03 | පින්ලන්තය - 01<br>නෙදර්ලන්තය - 01<br>කැනඩා – 01 |
| ආරක්ෂාව සහ සහයෝගිතා වැඩසටහන් | 10 | නේපාලය -02<br>බංගලාදේශය -03<br>පෝලන්තය – 01<br>නෙදර්ලන්තය – 01<br>තුර්කිය -01<br>චෙක් රිපබ්ලික් -01<br>ස්විට්සර්ලන්තය - 01 |
| CWC පාඨමාලා | 01 | නෙදර්ලන්තය-01 |
| රසායනික ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය | 07 | කාම්බෝජය– 02<br>වියට්නාමය -02<br>ජර්මනිය – 01<br>නෙදර්ලන්තය – 01<br>කටාර්- 01 |
| වෛද්‍ය පාඨමාලා | 03 | තුර්කිය - 03 |

*මූලාශ්‍රය: රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය*

# සමුපකාර සංවර්ධන අංශය

### හැඳින්වීම

සමුපකාර ක්ෂේත්‍රයේ සංවර්ධනය හා උන්නතිය සඳහා අවශ්‍ය රාජ්‍ය අංශයේ මැදිහත්වීම, මඟපෙන්වීම හා සානුබල සැපයීම සිදුකිරීමත්, පාරිභෝගික ආරක්ෂණය උදෙසා රාජ්‍ය දායකත්වය ලබාදීමත් සමුපකාර සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

## කාර්යභාරය

- සමුපකාර අංශය යටතේ ඇති සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, සමුපකාර සේවක කොමිෂන් සභාව, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යන ආයතන වල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- සමුපකාර ක්ෂේත්‍රය, පාරිභෝගික ආරක්ෂණය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා වාර්ෂිකව අයවැය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, බැංකු නියාමනය, පනත් රෙගුලාසි හා ප්‍රතිපත්ති සැකසීම, සංශෝධනය කිරීම ඇතුලු ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටුකිරීම.
- සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා කාලෝචිතව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම සහ මෙතෙක් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා පළාත් අමාත්‍යවරුන් හා පළාත් නිලධාරීන් සමඟ සාකච්ඡා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- සියළුම පළාත් සභා සමඟ සම්බන්ධීකරණය.
- ජනාධිපති කාර්යාලයෙන්, ආයතන වලින් හා පුද්ගලයින්ගෙන් ඉදිරිපත් වන පාරිභෝගික ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් ඉදිරිපත් වී ඇති දේශපාලන පළිගැනීම් සම්බන්ධ අභියාචනා පිළිබඳ කටයුතු කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**11.1:** වගුව

### මන්නාරම තාරාපුරම් සමුපකාර ගම්මානය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියට අදාලව කරනු ලබන කාර්යයන්

| | ව්‍යාපෘතිය හා ප්‍රගතිය | වියදම රු.මි.) |
|---|---|---|
| 01 | **ශ්‍රවණාගාරය ඉදිකිරීම ;** අත්තිවාරම දක්වා ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත. පස් පිරවීම් සිදුකිරීම සහ කොන්ක්‍රීට් කණු සකස් කර අවසන් කර ඇත. | 41.2 |
| 02 | **තාරාපුරම් වැව ආශ්‍රිත සංවර්ධනය;** භූමිය සකස් කිරීම, ඇවිදින මංතීරු සකස් කිරීම, ගල් ඇතිරීම සහ කොන්ක්‍රීට් තට්ටු සකස් කිරීම සිදුකර ඇත. | 35.65 |
| 03 | උපදේශන කාර්ය සිදුකිරීම වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට උපදේශන සේවා ගාස්තු ගෙවීම | 14.9 |
| 04 | **සම්මේලන මධ්‍යස්ථානයක් ඉදිකිරීම;** යෝජිත සම්මේලන මධ්‍යස්ථානය නිර්මාණය කිරීම හා ඉදිකිරීමේ කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබාදෙන ලදී. | 30.0 |

*මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන අංශය*

- සමුපකාර අරමුදල් කළමනාකරණ හා බැංකු නියාමන පිළිබඳව කටයුතු ද, පළාත් සමුපකාර කොමසාරිස් සමුළුව පැවැත්වීම ද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදුකිරීම.

*මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන අංශය*

# කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය -චක්‍රීය අරමුදල

**හැඳින්වීම**

### කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - (චක්‍රීය අරමුදල)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2012 මැයි මස 01 වන දින සිට SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

### ප්‍රධාන අරමුණු / පරමාර්ථ

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාර වල මූල්‍ය කටයුතු වලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාර වල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.
- අන්තර් මූල්‍ය ආයතන වල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය යටතේ නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර වල ඵලදායිතාවය වර්ධනය කිරීම හෝ එකී ආයතන වල ක්‍රියාකාරීත්වය සහ නිෂ්පාදන වල ගුණත්වය වර්ධනය කිරීම සඳහා අඩු පොලියට ණය පහසුකම් සපයනු ලැබේ. එසේම, සුළු හා කුඩා පරිමාණ ව්‍යාපාර වල හැකියාවන් වැඩි දියුණු කිරීමට හා නිෂ්පාදන වල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය සහභාගීත්ව ණය දෙන ආයතන 10 ක් (ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සී සී බැංකුව) හරහා ක්‍රියාත්මක වේ. ඉහත සහභාගීත්ව ණය දෙන ආයතන සමඟ උප ණය ගිවිසුම් අත්සන් කර, 2013 ජූලි මස සිට ණය නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

### පරිසර හිතකාමී ණය යෝජනා ක්‍රමය II - චක්‍රීය අරමුදල

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම, පාරිසරික ගැටළු විසඳීම සඳහා කටයුතු කිරීම, බලශක්ති පරිභෝජනය සහ පාරිසරික වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් ලබා දෙනු ලැබේ.

### 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ, 2013 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව තුල ණය අයදුම්පත් 13,671 ක් සහභාගීත්ව ණය දෙන ආයතන මඟින් හා ඍජුවම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබී ඇති අතර, එමඟින් උප ව්‍යාපෘතීන් 11,523 ක් ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන ව්‍යාපෘතීන් ලෙස තීරණය කර ඇත. උප ව්‍යාපෘතීන් 2,685 ක් සඳහා රු.බි. 11.8 ක් වෙන්කර ඇති අතර, එයින් උපව්‍යාපෘතීන් 2,418 ක් සඳහා රු. බි. 11.2 ක ණය මුදල් ප්‍රමාණයක් සහභාගීත්ව ණය දෙන ආයතන 10 ක් හරහා ලබා දී ඇත. 2018 වර්ෂය තුලදී රු. මි. 631 ක මුදලක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘතීන් වෙනුවෙන් නිදහස් කර ඇත.

- **පරිසර හිතකාමී ණය යෝජනා ක්‍රමය II - චක්‍රීය අරමුදල**

මෙම ව්‍යාපෘතිය යටතේ, 2017 දෙසැම්බර් මස සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව තුල ණය අයදුම්පත් 185 ක් සහභාගීත්ව ණය දෙන ආයතන මඟින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබී ඇති අතර, එමඟින් උප ව්‍යාපෘතීන් 98ක් ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන ව්‍යාපෘතීන් ලෙස තීරණය කර ඇත. එහි වටිනාකම රු.මි. 1,385කි. උප ව්‍යාපෘතීන් 09 ක් සඳහා රු. මි. 131 ක් මේ වන විට මුදල් නිදහස් කර ඇත. පවිත්‍ර ගංගා වැඩ සටහන සහ කලපු ආශ්‍රිත කර්මාන්තශාලා වලින් බැහැර කරන අපද්‍රව්‍ය අවම කිරීමේ වැඩ සටහන සම්බන්ධයෙන් ද දැනුවත් කිරීමේ වැඩ සටහන් කිහිපයක් පවත්වා ඇත.

# දෙපාර්තමේන්තු



# සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය දේශීය අනන්‍යතාවයකින් යුක්තව ක්‍රියාත්මක වූ අතරම එයට පහසුකම් සපයමින් 1982 අංක 17 දරණ සමාගම් පනත 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය. මෙම පනත වසර 25 ක් පමණ, ක්‍රියාත්මක වූ අතරම එම පනත තවදුරටත් සරල කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල් වීම සැලකිල්ලට ගෙන විශාල ආයෝජකයින් ආකර්ශණය කරගැනීමට පහසුකම් ලබා දෙමින් 2007 අංක 07 දරණ සමාගම් පනත 2007 මැයි මස 03 වන දින සිට ක්‍රියාත්මක වේ.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**14.1: වගුව**

### ප්‍රතිව්‍යුහගතකරණය- (eROC ව්‍යාපෘතිය)

| වැඩසටහන් හා ව්‍යාපෘති | ඇස්තමේන්තුව 2018 (රු.මි.) | ප්‍රගතිය | | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | | වියදම (2018 දෙසැම්බර් 31 දක්වා) (රු.මි.) | භෞතික ප්‍රගතිය | |
| **2501- ප්‍රතිව්‍යුහගතකරණය- (eROC ව්‍යාපෘතිය)** | | | | |
| (1.1) මෘදුකාංග සංවර්ධනය | 57 | - | 10% | පළමු අදියර අවසන් කර ඇත. |
| (1.2) දෘඩාංග හා යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම | 20 | 12.9 | 50% | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් අදියරේ පවතී |
| (1.3) බිම් සැලැස්ම (Space Planning) හා අභ්‍යන්තර අලංකරණය (Interior Design) නිර්මාණය | 13 | - | 10% | සැලසුම් කරමින් පවතී |
| (1.4) සමාගම් ලිපිගොනු ලිපිලේඛන ස්කෑන් කිරීම | 10 | - | 25% | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් අදියරේ පවතී |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

**14.2: වගුව**

### සංස්ථාගත කිරීම් සහ ලියාපදිංචි කිරීම්

| ක්‍රියාකාරකම් | ඉලක්ක 2018 | ළඟාකර ගැනීම 2018 දෙසැම්බර් 31 දක්වා | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| (1) නව සංස්ථාගත කිරීම් | 8,000 | 11,534 | 144 |
| (2) ලේඛන ලියාපදිංචි ප්‍රමාණය | 190,000 | 183,451 | 97 |
| (3) සමිති ලියාපදිංචි ප්‍රමාණය | 75 | 1,086 | 1,448 |
| (4) ලේකම්වරු ලියාපදිංචිය | 650 | 817 | 126 |
| (5) පොදු කොන්ත්‍රාත් ලියාපදිංචිය | 12,000 | 24,743 | 206 |
| එකතුව | **210,725** | **221,631** | **105** |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

**14.3: වගුව**

### ආදායම හා වියදම පිළිබඳ සාරාංශය

| ක්‍රියාකාරකම් | ඉලක්ක 2018 (රු.) | ළඟාකර ගැනීම 2018 දෙසැම්බර් 31 දක්වා (රු.) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| සමාගම් අරමුදලේ ආදායම | **360,000,000.00** | **440,500,512.00** | **122** |
| වියදම | | | |
| ශීර්ෂය 297 | 58,400,000.00 | 58,033,367.46 | 99 |
| සමාගම් අරමුදල | 187,571,100.00 | 88,441,225.70 | 47 |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

## දැක්ම

"ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය"

## මෙහෙවර

"ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සානුබල සපයමින්, සමුපකාර සමිති වල යහ පාලනයක් ගොඩනැගීම සඳහා පුළුල් ලෙස මැදිහත් වීම"

## ප්‍රධාන අරමුණු / පරමාර්ථ

- ප්‍රතිපත්ති සහ කලමනාකරණය
- සමුපකාර සමිති ලියාපදිංචිය හා අධීක්ෂණය
- සමුපකාර සමිති විගණනය සහ විමර්ශනය
- සමුපකාර ආරවුල් බේරුම්කරණය හා තීරකකරණය
- පළාත් සභා සමඟ සම්බන්ධීකරණය
- සමුපකාර සමිති වල බැංකු හා මුල්‍ය අංශ අධීක්ෂණය
- සමුපකාර ව්‍යාපාරයේ පාරිභෝගික අංශ සංවර්ධනය කිරීම
- සමුපකාර අරමුදල් කළමනාකරණය
- සමුපකාර ව්‍යාපාරය ප්‍රවර්ධනය හා සංවර්ධනය
- මානව හා භෞතික සම්පත් සංවර්ධනය

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**15.1: වගුව**

**2018 වර්ෂයේ ව්‍යාපෘති වල ප්‍රගතිය**

| ව්‍යාපෘතියේ නම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | නිමවුම | ප්‍රතිඵල |
| • ප්‍රකාශනය හා ප්‍රචාරණය හා සංඛ්‍යාන වාර්තාව. | සමුපදීපනී හා සංඛ්‍යාන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම | සිංහල හා දෙමළ මාධ්‍යයෙන් සමුපදීපනී පුවත්පත් අතිරේක 24 ක් හා 2017 සංඛ්‍යාන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම |
| • "නැණ ශක්ති" පාසල් වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | පාසල් සිසු දරුවන්ගේ අධ්‍යාපනය , නායකත්ව, කුසලතා සංවර්ධනය වීම හා සමුපකාර ව්‍යාපාරය පිළිබඳ පාසල් දරුවන් හා තරුණ තරුණියන් දැනුවත් වීම. | 5 ශිෂ්‍යත්වය, අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාග සඳහා සම්මන්ත්‍රණ දීප ව්‍යාප්තව පැවැත්වීම.<br><br>විශ්ව විද්‍යාල හා අධ්‍යාපන පීඨ සිසුන් සඳහා සමුපකාර ව්‍යාපාරය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම හා සමුපකාර සමිති පිහිටු වීම. |
| • මුල්‍ය සේවා නියාමනය. (ග්‍රාමීය බැංකු අධීක්ෂණය) | බැංකු නියාමන ජාතික කමිටු රැස්වීම් පැවැත්වීම.<br><br>බැංකු විදු පියස සමඟ ඒකාබද්ධව බැංකු නියාමනය පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම. | සමුපකාර ග්‍රාමීය බැංකු හා මුල්‍ය සේවා සමුපකාර සමිති නියාමනය ශක්තිමත් වීම. |

| ව්‍යාපෘතියේ නම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | නිමවුම | ප්‍රතිඵල |
| • කර්මාන්ත හා නිෂ්පාදන සමුපකාර සමිති සංවර්ධනය. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත සමිති සංගමයේ ආදායම් තත්ත්වය ඉහල නැංවීම. | නව නිෂ්පාදන කර්මාන්තයක් ආරම්භ කිරීම. (කොහු නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම) |

| | | |
|---|---|---|
| • කළමනාකරණ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම. | - | ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම හා අවශ්‍යතා හඳුනා ගැනීම.<br><br>*ADF Scanner, Cloud server & Physical server ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත.*<br><br>*ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර ඇත.*<br><br>වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.<br><br>SL CERT ආයතනය සමග වෙබ් අඩවිය විගණනය කිරීම. |

***මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව***

# මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

1995 අංක 35 දරණ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් නිරවද්‍ය මිනුම් ක්‍රම හා මිනුම් විද්‍යා සේවාවන් සැපයීම, අදාල නීති හා රෙගුලාසි පැනවීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම, ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වාගෙන යාම, අන්තර්ජාතිකව ඒවා යාවත්කාලීන කිරීම ආදිය දෙපාර්තමේන්තුවේ අරමුණු වේ.

.

**2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

**16.1:** වගුව

| වැඩසටහන | ප්‍රගතිය |
|---|---|
| • නිෂ්පාදන, ආනයනය කර විකිණීම, අලුත්වැඩියාකිරීම සහ විකිණීම සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම. | පුද්ගලයින් 522 ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම |
| • ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ආදායම් | උපකරණ 1,243 ක් අංක ශෝධනය කර ඇත. |
| • වෙළෙඳාම සඳහා භාවිතා වන මිනුම් උපකරණ සඳහා මාදිලි අනුමැතියෙන් ලබන ආදායම | ඒකක 80 ට මාදිලි අනුමැතිය ලබා දී ඇත |
| • සත්‍යායන වැඩසටහන් | ඒකක 667,275 ක් සත්‍යායනය කිරීම |
| • ක්‍රමාංකන විද්‍යාගාර සඳහා පුහුණුව ලබා දීම | ලබා දී ඇති පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 5 කි.<br>රජයේ ආයතන 4 ක් සඳහා නොමිලේ උපදේශන සේවා සැපයීම. |
| | |
| **වැඩසටහන** | **ප්‍රගතිය** |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් 863 ක් පවත්වන ලදි. |
| • වැටලීම් වැඩසටහන් | වැටලීම් 15,203 ක් සිදුකරන ලදි. |
| • ඉල්ලීම මත පෙර ඇසුරුම් භාණ්ඩ පරික්ෂාව | කර්මාන්ත 2ක් සඳහා සහතික නිකුත් කර ඇත |
| • කාර්යාල උපකරණ හා යන්ත්‍ර මිලදී ගැනීම. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය 2018.11.21 දින අමාත්‍යාංශය වෙත යවන ලදි.<br>ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි විය (භෞතික ප්‍රගතිය - 82%) |
| • කාර්යමණ්ඩලය සඳහා පුහුණුව ලබා දීම | දේශීය පුහුණු - පුද්ගලයින් 33<br>විදේශීය පුහුණු - පුද්ගලයින් 24 |

*මූලාශ්‍රය: මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව*

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමග සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

### 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**17.1:** වගුව

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රගතිය |
|---|---|---|
| නිල ඇඳුම් සැපයීම | 0.500 | සිසුන් 152 කට සපයා ඇත. |
| ජාතික ප්‍රදර්ශනය | 9.000 | දෙසැ. 03 හා 04 පවත්වන ලදී |
| සිසුන් පුහුණු දීමනා | 4.000 | 152 දෙනෙකු පුහුණු කර ඇත. |
| අමුද්‍රව්‍ය සැපයීම | 2.000 | ජකාඩ් මැෂින් 03 හා පරිගණක ගත ජකාඩ් මැෂින් 01 මිලදී ගෙන ඇත. |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාව | 0.600 | 142 දෙනෙකුට සපයා ඇත. |
| සේවාස්ථ පුහුණු පාඨමාලා | 5.500 | 630 දෙනෙකු පුහුණු කර ඇත. පාඨමාලා 34 පවත්වා ඇත. |
| ප්‍රවර්ධන ක්‍රියාකාරකම් | 3.600 | අප්‍රේල් 06/07/08 අලෙවි සල්පිළ පවත්වා ඇත. 125 දෙනෙකුට නිල ඇඳුම් සපයා ඇත. |
| නත් | 1.200 | මෙට්ට හා කොට්ට මිලදී ගෙන ඇත |
| විභාග | 0.600 | ජනවාරි හා ජූලි විභාග පවත්වා ඇත. |

*මූලාශ්‍රය: පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව*

# අධිකාරි, මණ්ඩල සහ කොමිෂන් සභා



# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**හැඳින්වීම**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාව තුල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම මඟින් ව්‍යවසාය සංවර්ධනය සඳහා ප්‍රමුඛ දායකත්වයක් දක්වන ආයතනයකි. ව්‍යවසායකත්ව සංවර්ධනය, මූල්‍ය පහසුකම් සඳහා යොමු කිරීම, වෙළඳපොල සම්බන්ධතා ඇති කිරීම, ව්‍යාපාර සංවර්ධන සහ පර්යේෂණ සිදුකිරීම සහ ව්‍යවසායකයන් සහ ව්‍යවසාය සංවර්ධන සේවා සපයන්නන් වෙත පහසුකම් සැලසීම අධිකාරිය මඟින් සිදුකරනු ලබයි. තවද, ව්‍යවසායකයන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම් සැකසීම, ගිණුම්කරණ, පොත් තැබීම සහ ඵලදායිතාවය නැංවීමේ වැඩසටහන් වැනි තවත් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මාර්ගෝපදේශ ග්‍රන්ථයක් සැකසීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා මාර්ගෝපදේශ ග්‍රන්ථයක් පලකිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැලසුම් කර ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් පිළිබඳව තොරතුරු එහි ඇතුලත් කර ඇති අතර (පිටු 200 ක් පමණ) එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට සාර්ථක ව්‍යාපාර අවස්ථා ආරම්භ කිරීම සඳහා ඉතාමත් ප්‍රයෝජනවත් මාර්ගෝපදේශයක් වනු ඇත. මේ සඳහා තොරතුරු සංවර්ධන නිලධාරීන් මඟින් සහ පුවත්පත් දැන්වීම් මඟින් ලබා ගන්නා ලදී. මෙම ග්‍රන්ථය 2019 වර්ෂයේදී එළිදැක්වීමට නියමිතය.

- **ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන**

ව්‍යාපාර සංවර්ධන සේවාවන්ගේ ධාරිතාවය ගොඩනැගීම සහ ව්‍යාපාර සහාය සේවාවන්ගේ විධිමත් ජාලයක් සැකසීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මේ වන විට ව්‍යාපාර සංවර්ධන සේවාවන්ගේ අවශ්‍යතා ඇගයීමක් සිදුකර ඇති අතර, අදාල නිලධාරීන් 25 ක් මේ සඳහා ව්‍යාපාර උපදේශනය පුහුණුව ලබා දෙන ලදී.

- **ප්‍රාදේශීය ව්‍යවසායක සම්මාන උළෙල**

ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් දක්වන ව්‍යවසායකයන් හඳුනා ගැනීම, ඇගයීමට ලක්කිරීම සහ අභිප්‍රේරණය කිරීම අරමුණු කර ගනිමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ප්‍රාදේශීය ව්‍යවසායක සම්මාන උළෙල පවත්වනු ලබයි. දිස්ත්‍රික් වාණිජ මණ්ඩල සහ රාජ්‍ය ආයතනයන් හි සහාය ඇතිව සියළුම දිස්ත්‍රික්කයන් හි සම්මාන උළෙල 09 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම වර්ෂයේදී පළාත් 8 ක මෙම උළෙලවල් පවත්වන ලදී.

- **දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද**

දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිටින ව්‍යවසායකයන් හට සපයන ව්‍යාපාර සංවර්ධන සේවාවන් සඳහා විධිමත් යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමේ අදහසින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද පිහිටුවා ඇත. දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති රාජ්‍ය සහ රාජ්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයනු ලබන ආයතන, වාණිජ මණ්ඩල සහ වෙළෙඳ සහ ව්‍යාපාර සංගම් වලින් මෙය සමන්විත වෙයි. ඒ අනුව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද පිහිටුවීමට සැලසුම් කර ඇත. 2018 වසර වන විට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දිස්ත්‍රික් ව්‍යවසාය සංසද 14 ක් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද 232 ක් පිහිටුවා ඇත.

- **පර්ෂද සංවර්ධන වැඩසටහන**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පර්ෂද සංවර්ධනය කිරීම සඳහා සම්බන්ධ වී ඇත. මූල්‍ය සහාය, තාක්ෂණික භුවමාරුව, ව්‍යවසායකත්ව සංවර්ධනය, වෙළෙඳපොල සංවර්ධනය වැනි අංශයන් සංවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි. 2018 වර්ෂයේදී සියලුම පළාත්වල හඳුනා ගත් ව්‍යාපාර පර්ෂද සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී (ප්‍රතිලාභීන් 315 ක් සඳහා).

- **ව්‍යාපාර වෙළෙඳපොළවල් පැවැත්වීම**

ප්‍රාදේශීය මට්ටමේ ක්ෂුද්‍ර හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. ප්‍රාදේශීය මට්ටමේ සිටින මෙම ව්‍යාපාරික ප්‍රජාව ව්‍යාපාර සංවර්ධන සේවා ආයතන පිළිබඳ ඇති දැනුම අඩු අතර මෙම ආයතන හා ව්‍යාපාරික ප්‍රජාව අතර ඇති පරතරය අවම කිරීම මෙහි එක් අරමුණකි. තවද, ප්‍රාදේශීය මට්ටමේ සිටින ව්‍යාපාරිකයින්ගේ නිෂ්පාදන වෙළෙඳපොලට හඳුන්වාදීමත් වෙළෙඳ සම්බන්ධීකරණයත් ඇති කිරීමත් මේ තුළින් සිදු කරයි. 2018 වර්ෂයේදී පළාත් මට්ටමින් වෙළෙඳපොළවල් 09 ක් සැලසුම් කල අතර පළාත් සියල්ලෙහිම සල්පිල් පවත්වන ලදී.

- **ඇසුරුම්කරණ සහාය අවශ්‍ය ප්‍රාදේශීය ව්‍යවසායකයන් සඳහා පහසුකම් සැලසීම**

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන සුපිරි වෙළෙඳසැල් සඳහා යොමු කිරීමට සුදුසු තත්ත්වයට ගෙන ඒම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පහසුකම් සපයනු ලබයි. ඒ අනුව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි සංවර්ධන නිලධාරීන් මඟින් හඳුනාගන්නා ලද විභව්‍ය සැපයුම්කරුවන්ගේ නිෂ්පාදනයන් හි ගුණාත්මකභාවය සහ නිෂ්පාදන සැපයීමේ ධාරිතාවය වැඩිකිරීමට කටයුතු කර ඇත. මෙම වර්ෂයේදී කෑගල්ල හා මාතර දිස්ත්‍රික්කයන්හි ප්‍රතිලාභීන් 90 ක් සඳහා පුහුණුව ලබා දෙන ලදී.

- **අන්තර්ජාතික ව්‍යාපාරික දූත මණ්ඩල වැඩසටහන**

ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා ව්‍යාපාරික දූත පිරිස් සහභාගී කරවීම සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට ඔවුන්ගේ ව්‍යාපාර

ජාත්‍යන්තරයට රැගෙන යාම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2018 ක්‍රියාත්මක සැලැස්මට අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය සමඟ එක්ව අන්තර්ජාතික ප්‍රදර්ශනයක් (Expo Manufacturing Exhibition) සඳහා ව්‍යාපාරිකයින් පිරිසක් තායිලන්තයට යවන ලදී. මේ සඳහා ව්‍යාපාරිකයින් 15 දෙනෙකු සහභාගී විය.

- **ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර හමුව පැවැත්වීම**

තිරසාර සහ සමාන ආර්ථික වර්ධනයක් සඳහා ව්‍යවසායකයන්ගේ කාර්යක්ෂම දායකත්වය ලබාගැනීම සඳහා ඔවුන්ගේ ධාරිතාවය සීමා වන ගැටළු කිහිපයක් ඇත. ඒවා අතර, ව්‍යවසායකත්ව දැනුම සහ කුසලතා අඩුවීම, ප්‍රාග්ධන වත්කම් සහ යටිතල පහසුකම් අඩුවීම, වෙළෙඳපොල සඳහා ඇති සීමිත ප්‍රවේශයන් සහ ප්‍රමාණවත් නොවන තාක්ෂණික කුසලතාවයන් වේ. මෙම ගැටළු ඉලක්ක කර ගත් සේවාවන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරනු ලබයි.

- **ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශ්‍රී ලාංකික ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි. මොවුන් තුළ ව්‍යවසායකත්වය, අලෙවිකරණය, තාක්ෂණය සහ මූල්‍ය කළමනාකරණය පිලිබඳ දැනුම මද භාවය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. මෙවැනි ව්‍යාපාර ආරම්භයේදී / ප්‍රසාරණය කිරීමේදී ඔවුන් මූල්‍ය දුෂ්කරතා වලට මුහුණපායි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන නිලධාරීන් මඟින් මෙවැනි දැනුම සහ කුසලතා අවශ්‍ය ව්‍යවසායකයින් හඳුනාගැනීම සිදුකරනු ලබයි.

එහෙයින්, ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගයෙන් සියළුම දිස්ත්‍රික්කයන් හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් කෙටිකාලීන පුහුණු වැඩසටහන් සහ පසුවිපරම් සේවාවන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් නව සහ පවතින ව්‍යාපාර සඳහා ව්‍යවසායකයින් 12,100 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

- **මාකඳුර ප්‍රදේශයේ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයක් සහ පෙරවැඩුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම**

තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයක් සහ පෙරවැඩුම් මධ්‍යස්ථානයක් යනු නව නිෂ්පාදනයක් හෝ සේවාවක් සඳහා ව්‍යවසායකයෙකු යොමු වීමේදී ඒ සඳහා ආයෝජනය කල යුතු මූලික ප්‍රාග්ධනය අඩු කර එහි ඇති අවදානම් තත්ත්වය අවම කිරීම සඳහා වෘත්තීමය වශයෙන් ආධාරක වන ස්ථානයකි.

මේ වන විට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සහ යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීමේ කටයුතු අවසාන කර 2017 සැප්තැම්බර් මස විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතිය තුළින් දැනට ව්‍යාපාරිකයාට සහ විශ්ව විද්‍යාල උපාධිධාරීන්ට සේවාවන් සපයමින් පවතී.

- **උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය**

උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කර ව්‍යවසායකයන් බවට පත් කිරීමේ අරමුණින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මෙම වැඩසටහන විශ්ව විද්‍යාල හා එක්ව දියත් කර ඇති අතර, එය “උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය” ලෙස නම් කර ඇත. උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීමට පෙළඹවීම තුළින් ඔවුන් සාර්ථක ව්‍යවසායකයන් බවට පත්කිරීම වැඩසටහනෙහි අරමුණයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මේ වර්ෂයේදී සබරගමුව, යාපනය, ජයවර්ධනපුර, ඌව වෙල්ලස්ස, සබරගමුව, රජරට හා කැලණිය යන විශ්ව විද්‍යාල වල උපාධිධාරීන් 205 ක් සඳහා පුහුණුව ලබා දී ඇති අතර 13 දෙනකු සඳහා මූල්‍ය පහසුකම් ලබා දී ඇත.

- **මානව සම්පත් සංවර්ධනය, තොරතුරු තාක්ෂණය, බදු සහ මූල්‍යන් පිළිබඳ ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම**

මෙහිදී ව්‍යාපාරික නීතිරීති හා ඉහත කරුණු සම්බන්ධව දැනුවත් කරන අතර දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරයි. දිස්ත්‍රික්ක 14 ක මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඇත.

- **ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් තරුණ ප්‍රජාව නංවාලීම**

මෙම වැඩසටහන, වෘත්තිය අධ්‍යාපනයෙහි නියැලී සිටින තරුණ පිරිස් සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහනකි. කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහන සිදු කරන අතර බස්නාහිර පළාතෙන් වැඩසටහන ආරම්භ කර ඇත.

මෙම වර්ෂයේදී ප්‍රතිලාභීන් 100 දෙනකු හඳුනාගත් අතර ඔවුන් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දී ඇත.මේ වන විට ඔවුන් සඳහා යන්ත්‍ර උපකරණ ලබා දීමට කටයුතු කරමින් පවතී.

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

### හැඳින්වීම

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරණ සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී. පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළඳ පිළිවෙත් වලට එරෙහිව වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. තවද, හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

19.1: වගුව

**මහජන පැමිණිලි සම්බන්ධයෙන් ගන්නා ලද පියවර**

| | |
|---|---|
| ලද පැමිණිලි සංඛ්‍යාව | **2,092** |
| (අ) තැපෑලෙන් | *1,714* |
| (ආ) දුරකථන ඇමතුම් මඟින් | *378* |
| වෙනත් ආයතන වෙත යොමු කරන ලද | 323 |
| වෙළඳපොළ වැටලීම් සඳහා යොමු කරන ලද | 67 |
| අවසන් කරන ලද පැමිණිලි | 482 |
| පවත්වන ලද සාකච්ඡා | 1,460 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

**පුද්ගල සහන සැලසීම උදෙසා පැමිණිලි සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශන**

| | |
|---|---|
| පවත්වන ලද විමර්ශන | 492 |
| විසඳන ලද විමර්ශන | 80 |
| නිකුත් කරන ලද නියෝග | 127 |
| පනවන ලද නියෝග | 61 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

19.3: වගුව

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව ගොනු කරන ලද නඩු**

| | |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 12 |
| අභියාචනාධිකරණය | 48 |
| මහාධිකරණය – අයදුම්පත් සංශෝධනය | 07 |
| දිස්ත්‍රික් උසාවි | 11 |
| කම්කරු විනිශ්චය සභාව | 03 |
| මහේස්ත්‍රාත් උසාවි | 02 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

19.1: ප්‍රස්තාරය

**වෙළඳපොළ වැටලීම් සහ දඩ පැනවීම්**




*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

## දඩ පැනවීම මගින් රජය වෙත අයකරගන්නා ලද මුදල්




*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

**19.4:** වගුව

### දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු )

| විස්තරය | ඉලක්කය (කාර්තුවකට දෙක බැගින්) | සම්පූර්ණ කරන ලද |
|---|---|---|
| ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම | - | 464 |
| සාමාන්‍ය ජනතාව | 6 | 423 |
| පාසල් සිසුන් දැනුවත් කිරීම | 7 | 209 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

- **අසාධාරණ වෙළඳ ක්‍රියාකාරකම් වලින් පාරිභෝගිකයන් ආරක්ෂාකිරීම**

දේශීය ව්‍යවසායකයන් ආරක්ෂා කිරීමේ අරමුණෙන් ආනයනික භාණ්ඩ 05 ක උපරිම මිල සම්බන්ධයෙන් රෙගුලාසි පනවන ලද අතර ඒ යටතේ උපරිම මිල සම්බන්ධයෙන් අදාළ ආනයනකරුවන්ගෙන් උපරිම සිල්ලර මිල සම්බන්ධ අයදුම්පත්‍ර 273 ක් ලද අතර ඔවුන් ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

**19.5:** වගුව

### පවතින වෙළඳපොළ මිල ගණන් පිළිබඳ අධ්‍යයනය

මිල පිළිබඳ සමීක්ෂණ පවත්වා පහත දැක්වෙන වාර්තා සකස් කරන ලදී.

| විස්තරය | වාර්තා සංඛ්‍යාව |
|---|---|
| කොළඹ සහ තදාසන්න ප්‍රදේශ පදනම් කරගෙන සකස් කළ වාර්තාවේ 18/20 වගන්තිය | 11 |
| දිස්ත්‍රික්ක මට්ටමේ දත්ත පදනම් කරගෙන අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල සිල්ලර මිල | 12 |
| එළවළු වල දෛනික සිල්ලර මිල පිළිබඳ වාර්තා | 160 |
| විශේෂ මිල වාර්තා | 200 |
| අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිල ගණන් පිළිබඳ වාර්තා | 160 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

**තරඟ විරෝධී සහ අසාධාරණ චර්යාවන් සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත යොමුකරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ව්‍යාපාරික මැදිහත් වීම පිළිබඳව විමර්ශන**

| කාර්යය | මුළු සංඛ්‍යාව |
|---|---|
| ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම | 10 |
| පූර්ව කාලයේ දී ලද පැමිණිලි | 40 |
| අදාළ කාලයේ දී ලද ලද පැමිණිලි | 25 |
| පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව වෙත යොමු කරන ලද පැමිණිලි | 03 |
| නියමිත කාලය තුළදී බැහැර කළ පැමිණිලි | 21 |
| ක්‍රියාකරමින් පවතින පැමිණිලි | 45 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

**19.7:** වගුව

### අංක 1505/15 දරණ 2007/07/11 දිනැති ගැසට් නිවේදනය යටතේ හඳුනාගන්නා ලද නිෂ්පාදන පහක් සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

| කාර්යය | මුළු සංඛ්‍යාව |
|---|---|
| ලද අයදුම්පත් සංඛ්‍යාව | 273 |
| ක්‍රියාකරන ලද අයදුම්පත් සංඛ්‍යාව | 273 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

**19.8:** වගුව

### මිල සංශෝධන අයදුම්පත්‍ර පිළිබඳ ඇගයීම් සහ නිර්දේශ

මෙම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පහත සඳහන් ඇගයීම් සහ නිර්දේශ ලබා දෙන ලදී.

| අයිතමය | අංකය |
|---|---|
| නිකුත් කරන ලද මිල නිශ්චය කිරීම් සංඛ්‍යාව | 100 |
| ලැබූ මිල නිශ්චය කිරීමේ අයදුම්පත්‍ර සංඛ්‍යාව | 162 |
| නිකුත් කළ අතුරු නියෝග සංඛ්‍යාව | 62 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

**19.9:** වගුව

## උසාවි නඩු

| වර්ගය | 2018 දෙසැම්බර් 31 දක්වා |
|---|---|
| ගොනු කරන ලද නඩු | 79 |
| අධිකරණ වල පෙනී සිටීම් | 438 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

- **නියෝග සහ විධාන නිකුත් කිරීම සහ අහෝසි කිරීම**
  - **නියෝග අංක 50** – නියෝග අංක 39 න් සම්පූර්ණ යොදය සහිත කිරිපිටි (දේශීය සහ ආනයනික) ඉවත්කිරීම.
  - **නියෝග අංක 51** – කිසිම නිෂ්පාදයෙකු, වෙළෙන්දෙකු හෝ බෙදාහරින්නෙකු විසින් දේශීයව ඇසුරුම් කළ/ බෝතල් කළ පානීය ජලය එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලකට වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ වෙළඳාම සඳහා සැපයීම නොකළ යුතුය.
  - **නියෝග අංක 52** – කිසිම වෙළෙන්දෙකු, බෙදාහරින්නෙකු ඇතුළු සැපයුම්කරුවෙකු විසින් සුදු සීනි (පැකට් කළ සහ පැකට් නොකළ) එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලකට වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ වෙළඳාම සඳහා සැපයීම නොකළ යුතුය.
  - **නියෝග අංක 53** – කිසිම ආනයනකරුවෙකු විසින් සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලකට තොග මිලට සුදු සීනි වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ වෙළඳාම සඳහා සැපයීම නොකළ යුතුය.
  - **විධාන අංක 65** – ශ්‍රී ලංකා ප්‍රමිති 743 හි සඳහන් ISO/TR 17276 අනුව සමෙහි ආලේප කරන ක්‍රීම් සහ ලෝෂන් වර්ග වල ද්‍රඩ ලෝහ මට්ටම අවසරලත් උපරිම මට්ටමට අනුකූල විය යුතුය.
  - **නියෝග අංක 66** – සමෙහි ආලේප කරන ක්‍රීම් සහ ලෝෂන් වර්ග වල බහා ඇති සෑම බෝතලයක, ඇසුරුමක හෝ බඳුනක අවශ්‍ය තොරතුරු කියවිය හැකි සහ නොමැකෙන පරිදි සලකුණු කිරීම අනුගමනය කිරීම.
  - **විධාන අංක 67** – කිසිදු වෙළෙන්දෙකු, ආහාරපාන සපයන්නෙකු හා / හෝ ආහාරපාන සැපයීමේ ව්‍යාපාරයක හෝ ඒ හා සමාන හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාවක / ක්‍රියාවලියක නිරත වන තැනැත්තෙකු / තැනැත්තන්, යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකයෙන් (GMP) සඳහා වූ තොරව එබඳු ව්‍යාපාරයක නිරත නොවිය යුතුය. සහතිකයෙන් (ශ්‍රී ලංකා ප්‍රමිති 956)

**19.10:** වගුව

### පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කටයුතු වල ප්‍රගතිය

| කාර්යය | පැමිණිලි සංඛ්‍යාව | |
|---|---|---|
| | ලද පැමිණිලි | සභාව විසින් තීරණ ගත් / විසඳු හෝ වාර්තා ඉදිරිපත් කළ පැමිණිලි (පූර්ව වර්ෂය ඇතුළත්ව) |
| මහජන අභිමතයට විරුද්ධව ක්‍රියාත්මක වන ප්‍රතිතරඟකාරී කටයුතු සම්බන්ධයෙන් සහන සැලසීමට සහතික වීම | 04 | - |
| භාණ්ඩ හා සේවා සඳහා උපරිම මිලක් නිර්දේශ කිරීම. | 08 | නිර්දේශය - 04 |
| අධික මිලගණන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම | 03 | නිර්දේශය - 01 |

*මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය*

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### හැඳින්වීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

2018 වර්ෂය තුළ විවිධ ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාවට නැංවීම මඟින් ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය සඳහා විවිධ සේවා සපයා ඇත. තවද, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සැකසීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය බැඳී සිටින අතර, එමඟින් ව්‍යාපාරිකයන්ට අවශ්‍ය වෙළෙඳපොළ දේශීය හා විදේශීය වශයෙන් පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා මැදිහත් වී ඇත.

- **ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2018**

ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය 10 වන වරටත් ශ්‍රී ලංකා පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සංගමයේ සහභාගීත්වයෙන් පෙබරවාරි මස 2 වන දින සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන ශාලාවේදී ආරම්භ කරන ලදී. මෙමඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඔවුන්ගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත පිවිසීමට හැකි වන පරිදි දිරිගන්වනු ලබයි.

- **ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනය (PRISL) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් 2018 පෙබරවාරි මස 21 වන දින අත්සන් කරන ලදී. ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනය, ප්ලාස්ටික් හා රබර් ක්ෂේත්‍රයේ නියුතු නිෂ්පාදකයින් වෙත සහාය වීම සඳහා පිහිටුවන ලද ජාතික වෘත්තීය ආයතනයකි. මෙම අවබෝධතා ගිවිසුම මඟින් ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා තාක්ෂණික අවශ්‍යතා පිළිබඳ ව පුළුල් තක්සේරුවක් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- **ලක්සල ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

2018 මාර්තු 23 වන දින කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙමඟින් ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මෙන්ම තරුණ තරුණියන්ගේ අවශ්‍යතාවය පරිදි දැව තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. තවද, කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ලක්සල ආයතනය අතර පවතින මෙම සහයෝගිතාවය තුළින් දැව කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය සේවාවන් තවදුරටත් පුළුල් කරගැනීම අපේක්ෂා කෙරේ.

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ISO 14001 පරිසර කළමනාකරණ ප්‍රමිතිය ලබාගැනීමට පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මාර්ගෝපදේශකත්වය හා සුපරීක්ෂණය යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය එක්ව ක්‍රියාත්මක කරන ලද ISO 14001 ජාත්‍යන්තර පරිසර කළමනාකරණ ප්‍රමිතිය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ලබාගැනීමට පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිමාවට පත්විය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණ වූයේ තෝරා ගන්නා ලද කර්මාන්ත 15ක භාවිතා වන තාක්ෂණය හා නිෂ්පාදන ක්‍රියාවලිය මඟින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමයි. ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකත්වය ලබාදුන් අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යටතේ සහතිකකරණය සිදුකරන ලදී.

බලශක්ති විගණනයන් හා විස්තරාත්මක ඇගයීම් තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා සම්පත් නාස්තිය අවම කිරීමට අදාල උපදේශනයන් මෙම තෝරා ගත් කර්මාන්ත සඳහා ලබාදුන් අතර එම ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික ආයෝජනයක් ලෙස රු. 300,000/-ක මුදල් ප්‍රතිපාදනයක් ද ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලදී.

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුම ලබාදීම.**

පූර්ව ඩිජිටල් යුගයේ දී පුවත්පත් දැන්වීම් හා අත් පත්‍රිකා වැනි මුද්‍රිත මාධ්‍ය උපයෝගී කරගනිමින් පමණක් ව්‍යාපාර තමන්ගේ ප්‍රචාරණ කටයුතු සිදු කල නමුත් වර්තමානය වන විට ගෝලීයකරණය හේතුවෙන් ඕනෑම සුළු පරිමාණ ව්‍යාපාරයක් වුව ද ඩිජිටල් මාධ්‍ය තුළින් තම ව්‍යාපාරික අදහස් අන්තර්ජාලය තුල ප්‍රචාරණය කිරීම සිදුකරනු ලබයි. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඩිජිටල් අලෙවිකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ අවබෝධය ලබාදීම උදෙසා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ඒකකය විසින් සම්මන්ත්‍රණයක් හා ඊට සමගාමීව වැඩමුළුවක් පවත්වන ලදී.

- **දෙරණ - කා.ස.ම. ව්‍යාපාරික සමාජය විසින් ලියාපදිංචි කර්මාන්තකරුවන්ට සාමාජිකත්වය පිරිනැමීමේ වැඩසටහන**

දිවයිනේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දේශීය හා විදේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් “Derana IDB Brand Excellence Programme” ක්‍රියාත්මක කරනු ලබයි. තවද, මෙමඟින් දේශීය ව්‍යාපාරිකයන් ජාතික ආර්ථිකයේ වඩා ක්‍රියාශීලී බලවේගය බවට පත්වීමට අවශ්‍ය ශක්තිය ලබාදේ.

දෙරණ ව්‍යාපාරික සමාජයේ නිල වෙබ් අඩවිය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් හා දෙරණ නාලිකාවේ ප්‍රධාන විධායක නිලධාරී විසින් එදින විවෘත කරන ලදී.

- **පුහුණු වැඩසටහන්**

ව්‍යවසායකයින්ගේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර එමගින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව, කළමනාකරණ, තාක්ෂණික හා යන්ත්‍රෝපකරණ නඩත්තුව වැනි ක්ෂේත්‍ර වල ඔවුන්ගේ හැකියාවන් ශක්තිමත් කරගැනීමට අවස්ථාව සැලසේ. පහත සඳහන් පරිදි 2018 ජනවාරි මස 31 වන දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ භෞතික ප්‍රගතියට අදාළ තොරතුරු අනුව පුහුණු වැඩසටහන් 300 ක් පවත්වන ලද අතර, ඊට අදාල ප්‍රතිලාභීන් ගණන 5,518 ක් වේ.

**20.1:** වගුව

**පුහුණු වැඩසටහන්**

| | වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 1 | කළමනාකරණ වැඩසටහන් | 180 | 2,155 |
| 2 | තාක්ෂණ හුවමාරු වැඩසටහන් | 120 | 3,363 |
| | එකතුව | **300** | **5,518** |

*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලය*

- **වාර්තා සැකසීම**

සමාලෝචන කාලය තුළ දී යන්ත්‍රෝපකරණ හා උපකරණ පිළිබඳව තක්සේරු වාර්තා, තාක්ෂණික වාර්තා සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තා බැංකු ණය පහසුකම් ලබාගැනීම හා අනෙකුත් අවශ්‍යතා සඳහා විවිධ වාර්තා සකස් කරන ලදී. මේ සම්බන්ධයෙන් සකස් කළ මුළු ව්‍යාපෘති වාර්තා සංඛ්‍යාව 502 ක් වන අතර ඊට අදාල වර්ගීකරණය පහත පරිදි වේ.

**20.2:** වගුව

**වාර්තා සැකසීම**

| | වාර්තා | වාර්තා සංඛ්‍යාව |
|---|---|---|
| 1 | යන්ත්‍රෝපකරණ තක්සේරු වාර්තා | 89 |
| 2 | ව්‍යාපෘති ශක්‍යතා වාර්තා | 92 |
| 3 | තාක්ෂණික වාර්තා | 321 |
| | එකතුව | **502** |

*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලය*

- **පවතින කාර්මික ජනපද නවීකරණය කිරීම**
  - ඉඩම් ඒකක 22 ක් කර්මාන්තශාලා ඉදිකිරීම වෙනුවෙන් වෙන් කර ඇත. එමඟින් නව ව්‍යවසායයන් 16 ක් අරඹා ඇති අතර නව රැකියා අවස්ථා 376 ක් උත්පාදනය කර ඇත.
  - කර්මාන්ත ඒකක 29 ක් සමඟ බදු කුලී ගිවිසුම් අත්සන් කිරීම.

- **සේවාවන්**

නවීන තාක්ෂණය හා යහපත් කළමනාකරණය තුළින් දේශීය නිෂ්පාදන වල ගුණත්වය වැඩිදියුණු කිරීම හා නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම මඟින් වෙළෙඳපොල ප්‍රවේශය ලබා ගැනීම ඇතුළු කටයුතු සඳහා අවශ්‍ය සේවා හා මාර්ගෝපදේශ සැපයීම වෙනුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය කටයුතු කරනු ලබයි. ඒ අනුව, 2018 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ භෞතික ප්‍රගතියට අනුව පහත දැක්වෙන පරිදි සේවා සැපයීමේ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 3,317කි.

**20.3:** වගුව

| | සේවාවන් | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ඉංජිනේරු සේවාවන් | 515 |
| 2 | වාත්තු, ලෝහ සහ රබර් කර්මාන්තයන්ට අමුද්‍රව්‍ය | 1,092 |
| 3 | තක්සේරු සේවා | 09 |
| 4 | කාර්මික තොරතුරු | 1,701 |
| | එකතුව | **3,317** |

*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලය*

**20.1:** ප්‍රස්තාරය




*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලය*

# සමුපකාර සේවක කොමිෂන් සභාව

**හැඳින්වීම**

සමුපකාර සේවක කොමිෂන් සභාව 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ පිහිටුවා ඇත. එහි අරමුණු වන්නේ සමුපකාර ක්ෂේත්‍රයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතභාවය සඳහා නෛතික විධිවිධාන පැනවීම, සේවක අභිප්‍රේරණයට අවශ්‍ය ක්‍රියාවලින් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ සමුපකාර ක්ෂේත්‍රයේ කාර්මික ආරවුල් විසඳීම හා උපදේශන සේවා සැපයීම වේ.

**දැක්ම**

"තෘප්තිමත් සමුපකාරික මානව සම්පතක් නිර්මාණය කිරීම"

**මෙහෙවර**

"සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා එම ක්ෂේත්‍රයෙහි මානව සම්පතෙහි අභිවෘද්ධිය පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම"

**ප්‍රධාන අරමුණු / පරමාර්ථ**

- සමුපකාර ක්ෂේත්‍රයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතභාවය සඳහා නෛතික විධිවිධාන පැනවීම.
- සේවක අභිප්‍රේරණයට අවශ්‍ය ක්‍රියාවලීන් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- සමුපකාර ක්ෂේත්‍රයේ කාර්මික ආරවුල් විසඳීම හා උපදේශන සේවා සැපයීම.

**කාර්යභාරය**

- සමුපකාර සමිති වලට සේවකයින් බඳවා ගැනීමේ දී, උසස් කිරීමේ දී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.
- සමුපකාර සමිති වල තනතුරු වලට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එවැනි තනතුරු වලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.
- සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිති වලට එරෙහිව නීතිමය පියවර ගැනීම.
- කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.
- ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියාමාර්ගයන් හි දී සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටීන් තීරණය කිරීම.
- මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

සමුපකාර සේවකයින්ගේ හා සමුපකාර සේවක කොමිෂන් සභා නිලධාරීන්ගේ දැනුවත් භාවය ඉහළ නැංවීම හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- 2018.12.31 වන විට සමුපකාර සේවකයින් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් හා කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන් 15 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි. 0.89 ක් වැය වී ඇත.

# රාජ්‍ය ව්‍යවසායයන් සහ වාණිජ ආයතන



# මාන්තායි සෝල්ට් සමාගම

**ලුණු නිෂ්පාදනය හා විකුණුම්**

| ලේවායේ නම | නිෂ්පාදන ඉලක්ක (මෙ.ටො.) | ළඟාකරගත් නිෂ්පාදනය (මෙ. ටො.) | ඇස්තමේන්තු විකුණුම (රු.) | ළඟාකරගත් විකුණුම (රු.) |
|---|---|---|---|---|
| මන්නාරම - ලේවාය | 4,900 | **5,906** | 52,185,000.00 | **79,986,600.00** |
| අලිමංකඩ - ලේවාය | 9,850 | **9,431** | 74,608,300.00 | **51,546,078.00** |

*මූලාශ්‍රය: මාන්තායි සෝල්ට් සමාගම*

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධව ඉතා දීර්ඝ ඉතිහාසයක් සහිත මාන්තායි සෝල්ට් සමාගම සාමාන්‍ය ලුණු නිෂ්පාදනය කර අයඩීන් මිශ්‍ර ලුණු, අඹරන ලද ලුණු සහ කර්මාන්ත සඳහා ලුණු යන විවිධ වර්ග වල ලුණු නිෂ්පාදන මෙරට නිපදවයි. ප්‍රධානතම ලුණු නිෂ්පාදන ප්‍රදේශය මන්නාරම සහ අලිමංකඩ ලුණු ලේවා ප්‍රදේශ වන අතර එහි පාලනය කොළඹ ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරයි.

මුදල් අමාත්‍යාංශයේ සහ අනිකුත් රජයේ දෙපාර්තමේන්තු වලින් නියෝජනය වන අධ්‍යක්ෂක මණ්ඩලයක් මඟින් ආයතනයේ පාලනය සිදු කරයි. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා මෙම ආයතනයේ කටයුතු එම අමාත්‍යාංශයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය මඟින් මූල්‍යමය හා නීතිමය පාලනය සිදු කරයි. 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ආයතනය ලියාපදිංචි කර ඇත.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **අලිමංකඩ ලුණු ලේවාය සංවර්ධනය**

**ව්‍යාපෘතියේ පරමාර්ථ:** ලේවාය නැවත ක්‍රියාත්මක කර මෙ.ටො. 20,000 ක ලුණු වසරකට නිෂ්පාදනය කර දේශීය රැකියා පසුබිම් උත්පාදනය.

**25.1:** වගුව

**ආයතනයේ අරමුදල් යටතේ පහත සඳහන් කාර්යයන් සැලසුම් කර ඇති අතර වැඩ කටයුතු කෙරෙමින් පවතී.**

| ක්‍රියාකාරකම | ඒකක මිනුම | භෞතික ප්‍රගතිය | | සටහන |
|---|---|---|---|---|
| | | ඉලක්කය | ළඟාකර ගැනීම | |
| මන්නාරම සඳහා ලුණු ඇඹරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම | 01 යන්ත්‍ර | 60% | 40% | පළමුවන පරීක්ෂාව සම්පූර්ණයි |
| මන්නාරම සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම | 01 ගොඩනැගිල්ල | 50% | 20% | සැලසුම සම්පූර්ණයි. |
| **එකතුව** | | | | |

*මූලාශ්‍රය: මාන්තායි සෝල්ට් සමාගම*

**25.2:** වගුව

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## හැඳින්වීම

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය ශ්‍රී ලංකාවේ පේෂකර්ම, ඇඟලුම් සහ පාවහන් කර්මාන්තයට අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමේ ආයතන අතර ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.  පුහුණුවට අමතරව ආයතනය මගින් උපදේශනය, තාක්ෂණික සේවා සහ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය පරීක්ෂනාගාර  පරීක්ෂණාගාර සේවා සපයනු ලබයි.  ආයතනය මගින් දිගුකාලීන ඩිප්ලෝමා, කෙටිකාලීන සහ කර්මාන්තශාලාවල අවශ්‍යතාවයන්ට අනුව පාඨමාලා මගින් පේෂකර්ම සහ ඇඟලුම් තාක්‍ෂණය හා කළමනාකරණය පිලිබඳ පුහුණුව ලබාදේ.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

- පුහුණුකිරීම
- පරීක්ෂණ
- උපදේශන සේවා
- තාක්ෂණ සේවා

- **2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

**30.1:** වගුව

**ආදායම(රු.මි.)**

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| පරීක්ෂණ | 83.5 | 43.9 | 44.87 | 48.65 | 48.65 |
| පුහුණුකිරීම් | 56.27 | 71.43 | 90.89 | 113.80 | 84.85 |
| උපදේශන සේවා | 1.1 | 3.57 | 4.25 | 5.25 | 4.5 |
| අනෙකුත් | 28.61 | 20.35 | 30.02 | 35.19 | 26.67 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **169.48** | **139.25** | **170.02** | **202.88** | **164.67** |
| මුළු මෙහෙයුම් වියදම | 142.86 | 158.13 | 153.92 | 167.72 | 162.83 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/ ඌණතාවය** | **26.62** | **(18.88)** | **16.11** | **35.16** | **1.84** |
| විලම්බිත ආදායම | 19.6 | 21.3 | 22.31 | 19.37 | 19.00 |
| **ශුද්ධ අතිරික්තය / ඌණතාවය** | **46.23** | **2.42** | **38.42** | **54.54** | **20.84** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

**30.1:** ප්‍රස්තාරය

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

**30.2:** ප්‍රස්තාරය




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

**30.3:** ප්‍රස්තාරය




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

**30.4:** ප්‍රස්තාරය




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

## භෞතික ප්‍රගතිය

**30.2:** වගුව

| ක්‍රියාකාරකම් | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| පරීක්ෂණ සංඛ්‍යාව | 65,031 | 39,424 | 43,937 | 49,529 | 47,478 |
| පුහුණුවන්නන් සංඛ්‍යාව | 4,319 | 4,402 | 4,048 | 5,409 | 3,751 |
| පාඨමාලා සංඛ්‍යාව | 144 | 151 | 237 | 201 | 137 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

**30.5:** ප්‍රස්තාරය




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

# ලංකා සතොස සමාගම

## හැඳින්වීම

ලංකා සතොස සමාගම මේ වන විට FMCG අංශයේ අත්‍යවශ්‍යය භාණ්ඩ වල මිල තීරකයා ලෙස වෙළෙඳපොළ අනෙකුත් තරඟකරුවන්ට අභියෝගයක් වෙමින් ශ්‍රී ලංකාවේ විශාලතම සිල්ලර වෙළෙඳ ජාලයට හිමිකම් කියනු ලබයි. ලංකා සතොස සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ස්ථාපිත කර ඇත. මෙහි කොටස් වලින් 97% ක් මහා භාණ්ඩාගාරය සතු වන අතර ඉතිරි 3% සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව සතු වේ.

2016 දී මෙම ව්‍යාපාර සංවිධානය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතට පත් කර අධ්‍යාපන මට්ටම හා පළපුරුද්ද මත වෘත්තීය කළමණාකරුවන් පිරිසක් එහි කළමණාකාරීත්වය සඳහා තෝරා පත්කර ගනු ලැබිණි. අපගේ දැක්ම මඟින් ඉලක්කගත වෙළෙඳපොළ වන, මිල පිළිබඳ අවධානය යොමු කරනු ලබන පහළ සහ මැදි ආදායම්ලාභී පාරිභෝගිකයන් පිළිබිඹු කෙරේ.

**කාර්යභාරය**

- ශ්‍රී ලංකාවේ වෙසෙන සමස්ථ ජනගහනය සඳහා සේවාවක් ලබාදීමට කාර්යක්ෂම හා සඵලදායී අලෙවිසැල් ජාලයක් ක්‍රියාත්මක කිරීම.
- සාධාරණ මිලක් යටතේ අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයීම.
- දේශීය ගොවීන් දිරිගැන්වීම උදෙසා ඍජුව මැදිහත් වීම.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**28.1:** වගුව

| අපේක්ෂිත නිමැවුම | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුළු මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| **වැඩසටහන සහ ව්‍යාපෘතිය: නව වෙළෙඳසැල් විවෘත කිරීම** | | | | |
| වෙළෙඳපොළ අභිමුඛව ලංකා සතොස ලිමිටඩ් හි ප්‍රචලිත බව වර්ධනය කිරීම | පිරිවැටුම හා ලාභදායකත්වය වර්ධනය කිරීම | 110.0 | 102.3 | වෙළෙඳ සැල් 20 ක් විවෘත කරන ලදී. |
| ආර්ථික පිරිමැසුම් හරහා ජීවන වියදම අඩු කිරීම | | | | |
| නවීන සිල්ලර වෙළෙඳපොළ අත්දැකීමක් සැපයීම තුළින් මැදි හා ඉහළ ආදායම් ලබන පාරිභෝගික කාණ්ඩයන් ග්‍රහණය කරගැනීම | | 150.0 | 276.1 | |

| අපේක්ෂිත නිමැවුම | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුළු මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| **වැඩසටහන සහ ව්‍යාපෘතිය: පැමිණීමේ වේලාව සටහන් කිරීමේ ඇඟිලි සලකුණු යන්ත්‍ර සැපයීම සහ ස්ථාපිත කිරීම** | | | | |
| සේවකයන්ගේ පැමිණීම සම්බන්ධව නිවැරදි තොරතුරු ප්‍රවාහයක් ලබාගැනීම | පැමිණීම සම්බන්ධව දත්ත රැස්කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ අතින් සිදු කරනු ලබන වාර්තා කිරීම අවම කිරීම | 15.0 | 12.3 | වෙළෙඳ සැල් 400 ක පැමිණීම සටහන් කිරීමේ ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කර ඇත. |
| වැඩකරන පැය ගණන සම්බන්ධව සිදුවන විකෘති කිරීම් අවම කිරීමේ පාලන විධියක් වශයෙන් (විශේෂයෙන් අතිකාල සම්බන්ධව) | සේවක පැමිණීම මෙහෙයවීම සම්බන්ධව ඇති පාලන විධි වර්ධනය කිරීම. | | | |

| අපේක්ෂිත නිමැවුම | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුළු මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| **වැඩසටහන සහ ව්‍යාපෘතිය: පවතින සතොස වෙළෙඳ සැල් ඉහල තත්ත්වයකට ගෙන එම** | | | | |
| වෙළෙඳසැල් වල ඇති සුරක්ෂිත බව ඉහළ නැංවීම | සේවකයන්ට සහ දේපළවලට ගින්නෙන් සිදුවන හානි අවම කිරීම | 8.0 | | ඩිජිටල් තරාදි 160 ක් මිලදී ගැනීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක වීම. |

| | | | | |
|---|---|---|---|---|
| වෙළෙඳසැල් කළමණාකරුවන් හට පද්ධති ප්‍රවේශ වීමේ බලය ලබා දීම හා විද්‍යුත් තැපැල් ලිපින ලබාදීම | තොරතුරු ලබා ගැනීම සඳහා වඩාත් හොඳ ප්‍රවේශ මාර්ග සැපයීම තුළින් වෙළෙඳ සැල් කළමණාක රුවන්ගේ ඵලදායකත්ව ය ඉහළ නැංවීම | 10.0 | | පරිගණක සැපයීමේ හා ගිනි නිවීමේ උපකරණ ස්ථාපිත කිරීමේ ටෙන්ඩර් ක්‍රියාවලිය ක්‍රියාත්ම ක වෙමින් පැවතිම. |
| මූලධර්මයන් තුළින් වෙළෙඳසැල් සවිමත් කිරීම. | පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම | 100.0 | | |

### වැඩසටහන සහ ව්‍යාපෘතිය: CCTV ව්‍යාපෘතිය (ක්‍රියාත්මක වෙමින් පවතින)

| අපේක්ෂිත නිමැවුම | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුළු මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| සොරකම් සහ දූෂණ (දුරාචාර) වැළැක්වීම මඟින් අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කිරීම | අවම අපතේ යාම් තුළින් ලාභදායකත්ව ය ඉහළ නැංවීම | 80.0 | 48.0 | වෙළෙඳ සැල් 317 න් 258 ක් සඳහා CCTV පද්ධති ස්ථාපිත කර තිබේ. |

### වැඩසටහන සහ ව්‍යාපෘතිය: (Franchise) වරලත් වෙළෙඳසැල් විවෘත කිරීම

| අපේක්ෂිත නිමැවුම | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුළු මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| ග්‍රාමීය වෙළෙඳපොළ අවකාශ වෙත ප්‍රවිශ්ට වීම හා ඔවුන් හට අවම මිලට අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයීම | ගුණත්වයෙන් යුතු භාණ්ඩ අඩු මිලට සැපයීම මඟින් ග්‍රාමීය අඩු ආදායම්ලාභී කාණ්ඩයට සේවා සැපයීම. | 27.0 | | |
| වෙළෙඳපොළ තුළ ලංකා සතොස වෙළෙඳසැල් ව්‍යාප්ත කිරීම | තරඟකරුවන්ට සාපේක්ෂව වෙළෙඳපොළ තුළ මූලිකත්වයට පැමිණීමත් ඒ හරහා ලැබෙන ප්‍රතිලාභ තුළින් ජාතියේ මිල තීරකයා බවට පත්වීම. | | | |
| ලංකා සතොස සන්නම් නාමයෙන් යුත් නිෂ්පාදන ප්‍රචලිත කිරීම. | ලංකා සතොස සන්නම් නාමයෙන් යුතු නිෂ්පාදන මඟින් ඉහළ දළ ලාභාන්තිකයක් තුළින් ලංකා සතොස ලිමිටඩ් හි ලාභදායිත්වය වර්ධනය කිරීම. | | | |
| ආර්ථික පිරිමැසුම් මඟින් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල පිරිවැය අඩු කිරීම (බෙදාහැරීමේ මාර්ග හා ධාරිතාවය කළමනාකරණය කිරීම මඟින්) සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු වන තොග වශයෙන් මිලදී ගැනීම් හරහා ලැබෙන වෙළෙඳ වට්ටම් සඳහා ඉහළ කේවල් කිරීමේ හැකියාවත් මිල අඩු කිරීමක් යනාදිය මඟින් ය | ව්‍යාපාරයේ සමස්ථ ලාභදායිත්වය ඉහළ නැංවීම | | | |
| **එකතුව** | | **500.0** | **438.7** | |

*මූලාශ්‍රය: ලංකා සතොස සමාගම*

# ජාතික ශිල්ප සභාව

## හැඳින්වීම

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

## කාර්යභාරය

- ප්‍රාදේශීය මට්ටමින් ශිල්පීන්ගේ සමිති පිහිටුවීම තුළින් ශිල්පීන් සංවිධානය කිරීම හා ශිල්ප ගම්මාන ඇති කිරීම.
- අත්කම් ශිල්පීන් හඳුනාගෙන ජාතික මට්ටමින් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම.
- ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම.
- අත්කම් භාණ්ඩ වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වැඩමුළු පැවැත්වීම.
- ගුරු ශිල්ප පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මගින් පූර්ණ කාලීන හස්ත කර්මාන්ත පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා නිෂ්පාදන පහසුකම් ලබා දීම.
- විදේශීය වෙළෙඳපොළ සඳහා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, දිරිගැන්වීම, ප්‍රදර්ශනය කිරීම හා විදේශ ප්‍රදර්ශන වලට ශිල්පීන් ඉදිරිපත් කිරීම.
- පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන සහ තරඟ පැවැත්වීම තුළින් ශිල්පීන් ඇගයීමට ලක් කිරීම සහ අළෙවි සල්පිල් පැවැත්වීම, ශිල්ප ගම්මාන පිහිටුවීම මගින් ශිල්පීන්ගේ නිෂ්පාදන භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා පහසුකම් සංවිධානය කිරීම.
- ශිල්පීන් සඳහා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිල්පීන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභා සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණ කිරීම.

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **ගුරු ශිල්පී පුහුණු වැඩසටහන**

පාරම්පරික හස්ත කර්මාන්තය තරුණ පරපුරට හඳුන්වා දෙමින් ඒවා සංරක්ෂණය කිරීම, රැකියා විරහිත තරුණ තරුණියන් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ස්වයං රැකියා වලට යොමු කරවීම සහ එමගින් ඔවුන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය නංවාලීම අරමුණු කරගෙන ගුරු ශිල්පී පුහුණු යෝජනා ක්‍රමය ජාතික ශිල්ප සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබයි.මෙම වැඩසටහන යටතේ ගුරු ශිල්පී පන්ති 72 ක් ක්‍රියාත්මක කර ඇති අතර, 798 දෙනෙකු සඳහා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ විධිමත් පුහුණුවක් ලබා දී ඇත. සියලුම ගුරු ශිල්පී පුහුණු පන්ති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපකරණ ද ලබා දී ඇත. (පිරිවැය රු. මි. 8.716).

- **ශිල්පීය පුහුණු ඒකකය**

ජාතික ශිල්ප සභාව යටතේ ක්‍රියාත්මක ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 112 ක් දිස්ත්‍රික් 19 ක හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 17 ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන අතර, එම මධ්‍යස්ථාන හරහා ආධුනිකයින් 875 කට මෙම වසරේ දී පුහුණුව ලබා දී ඇත (පිරිවැය රු. මි. 6.072). මධ්‍යස්ථාන මගින් පුහුණුව ලබන ආධුනිකයින්ට මසකට රු.1000/= බැගින් මාස 06 ක් සඳහා දීමනා ද ලබා දෙනු ලබයි.

- **අන්තර් මාධ්‍ය පුහුණු වැඩසටහන්**

හස්ත කර්මාන්ත නිෂ්පාදනයන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම, මෝස්තර හඳුන්වා දීම හා හස්ත කර්මාන්ත ප්‍රමිතිකරණය සඳහා අවශ්‍ය දැනුම හා තාක්ෂණය ලබා දීම තුළින් ශිල්පීන් දැනුවත් කිරීම සඳහා මෙම වැඩමුළු පවත්වනු ලැබේ.ඒ අනුව පුහුණු වැඩසටහන් 17 ක් ක්‍රියාත්මක කල අතර, පුහුණුව ලැබූ ශිල්පීන් සංඛ්‍යාව 433ක් විය(පිරිවැය රු. මි. 1.017).

- **"ශිල්ප සවිය" ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන - 2018**

පාරම්පරික හස්ත කර්මාන්ත ශිල්පීන් ව්‍යවසායකයන් බවට පත් කරමින් නව ව්‍යාපාර සන්නාම ලොව පුරා ප්‍රචලිත කිරීම මගින් ගෘහ ආර්ථිකය හා දේශීය ආර්ථික තත්ත්වය නගා සිටුවීම තුළින් තිරසාර ආර්ථික සංවර්ධන ඉලක්ක කරා ලඟා වීම මෙම වැඩසටහනේ ප්‍රධාන ඉලක්කය වේ. මෙම වැඩසටහන යටතේ ශිල්පීන් 27 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර "ශිල්ප සවිය" ප්‍රදර්ශනය ඔලන්ද රෝහල් පරිශ්‍රයේදී දෙසැම්බර් 19 සිට 21 දක්වා පවත්වන ලදී. (පිරිවැය රු. මි. 2.541).

- **"ශිල්ප අභිමානී" ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත සම්මාන උළෙල**

